# 2024 අංක 36 දරන විදුලිබල පනතට යෝජිත සංශෝධන පිළිබඳ සංකල්ප පත්‍රිකාව

කම්ටු වාර්තාව

2025 ජනවාරි 20

සිංහල පරිවර්තනය

පටුන


1. හැඳින්වීම 1

2. වත්මන් තත්ත්වය 2

3. මූලික අදහස් 4

3.1. ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ බලශක්ති ක්ෂේත්‍රයේ අඛණ්ඩ සංක්‍රාන්තීන් 4

3.2. ජාතික විදුලිබල උපදේශක සභාව 4

3.3. විදුලිබල කර්මාන්තය 5

3.4. ජාතික විදුලිබල වෙළඳපොළ 6

3.5. බලපත්‍ර දීම 8

3.6. සමස්ත විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ 8


4. යෝජනාව 9

5. නිර්දේශ 35

## කමිටු සාමාජිකයින්


1. මහාචාර්ය උදයංග හේමපාල, බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් - කමිටු සභාපති
2. ඉංජි. පුබුදු නිරෝෂන් හැඩිගල්ලගේ, අධ්‍යක්ෂ ජනරාල්,විදුලිබල ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය - කමිටුවේ ප්‍රධාන ලේකම්
3. චන්දන විජයසිංහ, අතිරේක ලේකම්, බලශක්ති අමාත්‍යාංශය - කමිටුවේ කැඳවුම්කරු
4. ආචාර්ය තිලක් සියඹලාපිටිය, සභාපති, ලංකා විදුලිබල මණ්ඩලය
5. ඉංජි. ජනක අලුත්ගේ, සභාපති, ලංකා විදුලි පුද්ගලික සමාගම
6. මහාචාර්ය අතුල රාජපක්ෂ, මහාචාර්ය, විදුලි හා පරිගණක ඉංජිනේරු අධ්‍යනාංශය, මැනිටෝබා විශ්වවිද්‍යාලය
7. මහාචාර්ය ලිලන්ත සමරනායක, පීඨාධිපති, ඉංජිනේරු පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
8. ආචාර්ය තුෂාරා රත්නායක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉංජිනේරු පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය
9. ඉංජි. කෝසල කඹුරුදෙණිය, සභාපති (2024-25), ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
10. ආචාර්ය ඉන්ද්‍ර මහකලන්ද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, තීරණ විද්‍යා අධ්‍යනාංශය, මොරටුව විශ්වවිද්‍යාලය









# 1. හැඳින්වීම

අධික විදුලි පිරිවැය, ආනයනික පොසිල ඉන්ධන මත අධිකව යැපීම, නව විදුලි උත්පාදන බලාගාර විදුලිබල පද්ධතියට එක්කිරීමේ ප්‍රමාදවීම්, පාලනයේ ආකාර්යක්ෂමතාවන් සහ තිරසර බලශක්ති සංක්‍රාන්තියක් උදෙසා උපාය මාර්ගික දැක්මක් නොමැතිකම වැනි බහුවිධ අභියෝගයන්ට මුහුණ පාමින්, ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය තීරණාත්මක සන්ධිස්ථානයක් පසුකරමින් සිටියි. මෙම අභියෝග ජය ගැනීම සඳහා විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සහ විදුලිබල ක්ෂේත්‍රයේ ආයතන නිසි ලෙස ප්‍රතිව්‍යුහගත කිරීම අනිවාර්යෙන් සිදුකළ යුතුව ඇත.

අරමුණුගත පාර්ශ්වකරුවන්ගේ උපදේශනයකින් අනතුරුව, 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත (විදුලිබල පනත) 2024.06.06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද අතර, එය පාර්ලිමේන්තු පනතක් බවට පත් වූයේ 2024.06.27 දින දී ය. මෙම පනතේ පරමාර්ථ, (අ) ස්වාධීන සහ වගකීමෙන් බැඳී සිටින සංස්ථාමය අස්තිත්ව හරහා වැඩිදියුණු වූ විදුලිබල කර්මාන්තයේ කාර්යසාධනය සහතික කිරීම (ආ) ස්වාධීන සහ වගකීමෙන් බැඳී සිටින සංස්ථාමය අස්තිත්ව පිහිටුවීම සඳහා පහසුකම් සැලැස්වීම, (ඇ) තොග විදුලිබල වෙළෙඳපොළ පිහිටුවීම සහ එහි ක්‍රියාකාරීත්වය සඳහා පහසුකම් සැලැස්ම හා ප්‍රවර්ධනය කිරීම, (ඈ) විදුලිබල කර්මාන්තයේ තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම, (ඉ) බලපත්‍රලාභීන් වෙත නිකුත් කරන ලද අදාළ බලපත්‍රවලින් බලය ලබා දී ඇති හෝ නියම කර ඇති කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කරනු ඇති බව සහතික කිරීම, (ඊ) විදුලිබලය සඳහා වූ සියලු සාධාරණ ඉල්ලීම් සපුරා ඇති බවට සහතික වීම, (උ) වැඩිදියුණු කරන ලද ආරක්ෂක ප්‍රමිතීන්, විශ්වසනීයත්වය සහ සේවාවල ගුණාත්මකභාවය මගින් අන්තරායයන්ගෙන් මහජනතාව ආරක්ෂා කිරීම, (ඌ) අයක්‍රම මූලධර්ම හඳුනා ගැනීම, සහ (එ) විදුලිබල කර්මාන්තයේ කාබන්හරණය සැලසීම සහ පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම, වශයෙන් සඳහන් කර ඇති අතර, ඒවා විදුලිබල පනතේ 2 වැනි වගන්තියෙන් සවිස්තරාත්මකව දක්වා ඇත.

විදුලිබල ක්ෂේත්‍රය ප්‍රතිසංස්කරණය කිරීම උදෙසා අත්‍යවශ්‍ය බොහෝ ධනාත්මක පැතිකඩයන් පිළිබඳව විදුලිබල පනත තුළට අන්තර්ගත කර තිබුණ ද, එම ක්ෂේත්‍රය කෙරෙහි යෝග්‍ය නොමැති, අත්‍යවශ්‍ය නොමැති හෝ අනර්ථකාරී වන ආයතන, විධිවිධාන සහ වෙළඳ ගනුදෙනු කටයුතු කිහිපයක් ද එහි ඇතුළත් වේ. ඇතැම් යෝජිත ආයතන සහ ඒවායේ කාර්යභාරයන් සහ වගකීම් විදුලිබල පනතේ ප්‍රකාශිත පරමාර්ථ සැපිරීමෙහිලා සමත් නොවනු ඇති අතර එමගින් සිදුවන්නේ විදුලිබල කර්මාන්තයට හා පාරිභෝගිකයන් මත අමතර බවක් පැටවීම ය. විදුලිබල පනතේ ඇති ඇතැම් විධිවිධාන දැරිය හැකි හා සුරක්ෂිත විදුලිබල සැපයුමට බලපෑම් ඇති කළ හැකිවාක් මෙන් ම සංක්‍රාන්තිය අතිශයින් ම සංකීර්ණ කරවයි. මෙම ගැටළු පිළිබඳව පෙර පැවති පාර්ශ්වකරුවන්ගේ උපදේශනවලදී සිදු කරන ලද ඇතැම් ඉදිරිපත් කිරීම් වලදී ද නිරීක්ෂණය කර ඇත.

ඉහත කරුණු සම්බන්ධයෙන් මෙන්ම දැරිය හැකි, සුරක්ෂිත සහ පිවිතුරු බලශක්ති ක්ෂේත්‍රයක් කරා ගමන් කරන්නා වූ ප්‍රජාමූල බලශක්ති සංක්‍රාන්තියක් උදෙසා වන ජනතා අභිලාෂය සැලකිල්ලට ගනිමින්, විදුලිබල පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම, උපදෙස් විමසීම සහ නිර්දේශ ලබා දීම සඳහා 2025 ජනවාරි 7 වන දින මෙම කමිටුව පත් කරනු ලැබීමට අමාත්‍ය මණ්ඩලය විසින් බලශක්ති අමාත්‍යාංශයේ (MoE) ලේකම් වෙත බලය පවරන ලදී.

## 2. වත්මන් තත්ත්වය

විදුලිබල පනත ප්‍රධාන වගන්ති 53ක් ඔස්සේ ලේඛනගත කර ඇති අතර විදුලිබල පනතේ 1 වන වගන්තියේ දක්වා ඇති පරිදි එක් එක් වගන්තිය ක්‍රියාත්මක දිනයන් 1 වන වගුවෙන් දැක්වේ. බලශක්ති අමාත්‍යවරයා (අමාත්‍යවරයා) විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් 'නියමිත දිනය' නියමු කරනු ලැබිය යුතු ය; එසේ වුව ද, එවැනි නියමයක් කිරීමට පෙර මූලික පැවරුම් සැලැස්ම, ජාතික අයක්‍රම ප්‍රතිපත්තිය ඇතුළත් ජාතික විදුලිබල ප්‍රතිපත්තිය, වාර්ෂික විදුලිබල ප්‍රසම්පාදන සැලැස්ම සහ දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම විදුලිබල පනතේ විධිවිධාන ප්‍රකාරව නිසි ලෙස සකස් කර, අනුමත කර ඇති බවට අමාත්‍යවරයා සෑහීමට පත් විය යුතු ය. නියමිත දිනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ නොමැති නම්, අදාළ වගන්ති සහ උපවගන්ති පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දින සිට මාස දොළහක් ඉකුත් වූ වහාම ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.

| **ක්‍රියාත්මක වූ දිනය** | පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වූ 2024 ජුනි 27 වන දින | නියමිත දිනයේදී හෝ ගැසට් පත්‍රයේ නියමිත දිනයක් පළ කරනු ලැබ නොමැති නම්, 2024 ජුනි 27 වන දින සිට මාස 12 ක් ඉකුත් වූ වහාම | අමාත්‍යවරයා විසින් නියමයන් සිදුකරනු ලබන විවිධ දිනයන්හිදි |
|---|---|---|---|
| **වගන්ති** | 1 වන වගන්තියේ දක්වා ඇති පරිදි 1 වන වගන්තියේ, 2, 3, 4, 9 වගන්තිවල, (1) වන උපවගන්තියේ, (2) වන උපවගන්තියේ (ආ) ඡේදය,10 වන වගන්තියේ (3) සහ (5) උපවගන්ති සහ 14, 15, 17,18, 38, 39 යන වගන්තිවල විධිවිධාන. | 1 වගන්තියේ දක්වා ඇති පරිදි 5, 6, 7, 8 යන වගන්ති, 10 වන වගන්තියේ,11, 12, 16, 19, 20,21, 22, 23, 24, 25,26, 27, 28, 29, 30,31, 32, 33, 34, 35,36, 37, 40, 41, 42,43, 44, 45, 46, 47,48, 49, 50, 51, 52,53 යන වගන්තිවල විධිවිධාන. | 1 වගන්තියේ දක්වා ඇති පරිදි 13 වන වගන්තියේ විධිවිධාන, IX වන කොටසේ විධිවිධාන. |

වගුව **1**

විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ සැපයුමට අදාළව ලංකා විදුලිබල මණ්ඩලය (CEB) විසින් සිදුකරන කටයුතු ආයතනවලට වෙන් කිරීම (unbundling) සඳහා වූ යෝජනා, උපාය මාර්ග සහ ව්‍යුහය විදුලිබල පනතේ I වන උපලේඛනයේ සවිස්තරව දැක්වේ.

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමිත සමාගම් සංස්ථාගත කිරීම සහ ලංකා විදුලිබල මණ්ඩලයෙහි ප්‍රතිව්‍යුහගත කරන ලද කටයුතු එම සමාගම් සතු කිරීම ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් 17 වන වගන්තියෙන් විස්තර කර ඇති අතර ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ සංක්‍රාන්තිය, පැවරීම සහ ප්‍රතිසංවිධානය සැලසීම සඳහා 'පැවරුම් සැලැස්ම' පිළියෙල කිරීම සම්බන්ධයෙන් විදුලිබල පනතේ 18 වන වගන්තියෙන් විස්තර කර ඇත.

විදුලිබල පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යවරයාට සහාය වීමේ කාර්යය සඳහා 'විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය' (PSRS) යනුවෙන් හඳුන්වනු ලබන ලේකම් කාර්යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය. විදුලිබල පනතේ 38 වන වගන්තියේ සඳහන් කර ඇති පරිදි, නව සමාගම් සංස්ථාගත කිරීම, නියෝග පිළියෙල කිරීම, මූලික පැවරීමේ සැලැස්ම සහ අවසාන පැවරීමේ සැලැස්ම පිළියෙල කිරීම, සම්පූර්ණ සහ කාර්යක්ෂම මූලාමය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් සකස් කිරීම සහ ප්‍රතිව්‍යුහගතකරනු ලැබූ ක්ෂේත්‍රයේ සැලසුම්, ප්‍රසම්පාදනය සහ මෙහෙයුම් සිදුකිරීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරුගේ (NSO) ධාරිතා වර්ධනයට මුලපිරීම ඇතුළුව විදුලිබල පනතේ දක්වා ඇති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට සහාය වීම, මඟපෙන්වීම සහ අධීක්ෂණය කිරීම විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයෙහි කාර්යය සහ කර්තව්‍ය වේ.

කෙසේවුවද, නියමිත දිනට පෙරාතුවම වූ දිනට ලංකා විදුලිබල මණ්ඩලයෙහි තනතුරු දරනු ලබන ලංකා විදුලිබල මණ්ඩලයෙහි සියලුම නිලධාරීන් සහ සේවකයින්ට අදාළ අනුප්‍රාප්තික සමාගම් වෙත යොමු කරනු ලබන ඔවුන්ට අදාළ යෝජිත අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් දැනුම් දිය යුතුව තිබූ දිනය වූ 2024.10.27 වන දින වන විට, එනම් විදුලිබල පනතේ 18 වන වගන්තිය ක්‍රියාත්මකභාවයට එළැඹී මාස හතරක් ඇතුළත, නව සමාගම් සංස්ථාගත කරනු ලැබීම සහ මූලික පැවරුම් සැලැස්ම කඩිනමින් සකස් කරනු ලැබීම සඳහා පහසුකම් සැලසීමට විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය විසින් අපොහොසත් වී තිබුණි.

පසුව, 2024.11.21 දින නව පාර්ලිමේන්තුව රැස්වීමෙන් අනතුරුව අමාත්‍යවරයාගේ අනුමැතියෙන් යුතුව, ප්‍රගතිශීලී සංශෝධනයක් සිදුකරනු ලැබීම පිණිස විදුලිබල පනත යළි සලකා බැලීම සඳහා වන නව රජයේ අභිප්‍රාය, බලශක්ති අමාත්‍යාංශය සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලංකා විදුලිබල මණ්ඩලයෙහි සියලුම නිලධාරීන් සහ සේවකයින් වෙත ද, අදාළ සියලුම පාර්ශවකරුවන් වෙත ද දැනුම් දීමට කටයුතු කර ඇත.

මේ වන විට මෙම කමිටුව විසින් නොයෙකුත් ප්‍රධාන පාර්ශවකරුවන් විසින් දැනට ක්‍රියාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට අදාළව හඳුනාගැනීමට සමත්ව ඇති මූලික ගැටළු වර්ගීකරණයට ලක් කිරීම සිදු කර ඇති අතර විදුලිබල පනත සංශෝධනය කිරීම පිළිබඳ වූ නිර්දේශ සමඟින් විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සිදුකිරීමේ සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ ඉදිරි පියවර යෝජනා කරනු ලබයි.

## 3. මූලික අදහස්

අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද පෙර පැවති කමිටුවල හා ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ විවිධ නිර්දේශ මගින් සහ ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් මගින් මේ වන විට විදුලිබල පනතේ පවතින හිදැස් අඩුපාඩු විසඳීම සඳහා ඊට ව්‍යවස්ථාමය සංශෝධනයන් සිදුකිරීමේ අවශ්‍යතාව පෙන්වා දී ඇත.

### 3.1. ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ බලශක්ති ක්ෂේත්‍රයේ අඛණ්ඩ සංක්‍රාන්තීන්

රජය විසින් අනුමත කරනු ලැබ ඇති පරිදි, ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග, 2019.08.09 දිනැති අංක 2135/61 දරන අති විශේෂ ගැසට් පත්‍රය තුළින් ප්‍රකාශයට පත් කර ඇත. අවම වශයෙන් වසර හයකට වරක් හෝ ප්‍රතිපත්ති සමාලෝචනයන් සිදු කළ යුතු අතර මෙම ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග හා සමගාමීව සිදුකෙරෙන ප්‍රතිඵල සැලසීමේ කාර්යරාමුව (Results Delivery Framework) මෙම ජාතික බලශක්ති ප්‍රතිපත්ති රාමුවට අනුකූලව වසර දෙකකට වරක් සංශෝධනය කළ යුතු ය.

බලශක්ති ක්ෂේත්‍රය තුළ අඛණ්ඩව පරිවර්තනයන් සිදුවීමේ සංක්‍රාන්ති ස්වභාවය සැලකිල්ලට ගනිමින්, බලශක්ති ක්ෂේත්‍රයට අදාළ රජයේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ගවලට අනුකූලව ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම සිදුකළ යුතු ය.

මෙම අඛණ්ඩ බලශක්ති සංක්‍රාන්තිය උදෙසා ශක්තිමත් කර්මාන්ත සහ නියාමන නීති සහ පනත් මගින් පිටුබලය ලබා දිය යුතුව ඇත. බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රජා සහභාගීත්වය සහ රජයේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සවිබලගැන්වීමට සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා ඵලදායී යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීමට නව නීති සම්පාදනය කිරීම අවශ්‍යව පවතී.

සෑම වසර පහකට වරක් සමාලෝචනය කෙරෙනු ඇති හා යාවත්කාලීන කෙරෙනු ඇති ජාතික විදුලිබල ප්‍රතිපත්තියක් සකස් කිරීම වත්මන් විදුලිබල පනතට අනුව පවතින අවශ්‍යතාවයි. එසේවුවද, විදුලි බලය යනු ජාතික බලශක්ති ප්‍රතිපත්තියේ සංඝටනීයව අන්තර්ගත වන අංශයක් වන හෙයින් එය හුදකලාව වෙන් කරමින් සලකා බැලීම සිදුනොකළ යුත්තේ එවැනි ප්‍රවේශයක් ආර්ථික, මූල්‍යමය, තාක්ෂණික සහ වෙනත් අකාර්යක්ෂමතාවන්ට හේතු සාධක විය හැකි නිසාවෙනි. විදුලිබල ක්ෂේත්‍රය හා සම්බන්ධ කරුණු පැහැදිලිවම ආවරණය කෙරෙනු ලබන ප්‍රතිඵල සැලසීමේ කාර්යරාමුව මගින් විදුලිබල ක්ෂේත්‍රයට අදාළව ප්‍රතිපත්ති අනුවර්තනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වඩාත් ගතික සහ නම්‍යශීලී රාමුවක් සපයනු ලබයි. එහෙයින් වෙනම ජාතික විදුලිබල ප්‍රතිපත්තියක් සකස් කිරීම කිරීම ගැටළු සහගත ය. ඒ වෙනුවට, සිදුකළ යුතුව පවතින්නේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කරමින් එය විධිමත් කිරීම ය.

### 3.2. ජාතික විදුලිබල උපදේශක සභාව

ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කිරීමේදී අමාත්‍යවරයා වෙත අයකුම ප්‍රතිපත්තිය ඇතුළුව ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කිරීම, ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම (LTPSDP) සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් උපදෙස් දීමේ වගකීම ජාතික විදුලිබල උපදේශක සභාව (NEAC) වෙත පැවරී ඇත. කෙසේවුවද, නියාමක ලෙස කටයුතු කරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) වෙත ඒවාට අදාළ වූ පනත් මගින් සහ 2009 විදුලිබල පනත හරහා මෙම කාර්යයන් පැවරීම සිදුකර ඇත. අතීතයේ දී එම කාර්යයන් ඉටු කිරීමේදී අඩුපාඩු නිරීක්ෂණය වී ඇති නමුත්,මෙම කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීමේ වගකීම මෙම අදාළ ආයතන සතුවන්නේ ය.ඊට අමතරව, ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම, සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා

අමාත්‍යවරයා හට විශේෂඥ උපදේශකයින් අවශ්‍ය කරන්නේ නම්, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව, පවතින ක්‍රියාපටිපාටින් අනුගමනය කරමින් ඕනෑම අවස්ථාවක එකී උපදේශකයින් පත් කරනු ලැබිය හැකිය. ජාතික විදුලිබල උපදේශක සභාව දැනට පවතින ආයතනවල සහ ජාතික පද්ධති ක්‍රියාකරු සතු ස්වාධීන කාර්යයන් එලෙසම නැවත නැවතත් ක්‍රියාත්මක කරමින් සහ ඒවාට මැදිහත් වී බාධා ඇති කරමින් සිටින අතර එමඟින් සමස්ත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ සැබෑම අරමුණ අඩපණ කරවමින් තිබේ. එහෙයින්, ජාතික විදුලිබල උදේශක සභාවක් අවශ්‍ය නොවන බව කමිටුවේ මතය යි.

### 3.3. විදුලිබල කර්මාන්තය

වත්මන් රජයේ බලශක්ති ප්‍රතිපත්තිය තුළ විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම සහ බෙදා හැරීම සම්බන්ධයෙන් පිළිවෙලින් පහත සඳහන් කරුණු සඳහන් වේ;

(i) දැනට රජය සතු ජල විදුලි බලාගාර, පුනර්ජනනීය බලශක්ති බලාගාර, ගල් අඟුරු බලාගාරය සහ අනෙකුත් සියලුම ප්‍රධාන විදුලි බලාගාර රජයේ හිමිකාරීත්වය යටතේ පවතිනු ඇති බව සහ විදුලිබල උත්පාදනය කිරීම සඳහා පුද්ගලික ආයෝජන සුරක්ෂිත කිරීම සහ ඉහළ නැංවීම සිදුකරනු ලබන බව.

(ii) සම්ප්‍රේෂණ ජාලය, පද්ධති පාලන මධ්‍යස්ථානය සහ තොග විදුලිය මිලදී ගැනීම් සහ ප්‍රේෂණය කිරීමේ කටයුතු ක්‍රමවත් විගණනයන් සහිතව රජයේ හිමිකාරීත්වය යටතේ ඉදිරියටත් ක්‍රියාත්මක වනු ඇති බව.

(iii) පාර්ශ්වකරුවන්ගේ පුළුල් වූ උපදේශන, පාරිභෝගික සහභාගීත්වය සහ විශේෂඥ උපදෙස් අනුගමනය කරමින්, බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ව උසස් පාරිභෝගික සේවාවක් සහ සහභාගීත්වයක් සහිත වූ ආයතනවලට ප්‍රතිව්‍යුහගත කරනු ලබන බව.

ඉහත ලැයිස්තුගත කර ඇති අයිතමයන් ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය හරහා ප්‍රබල ජනතාවරමක් හිමි කරගැනීමට සමත් වූ මහජනතාව වෙත ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්තිය තුළ ද අන්තර්ගතව තිබුණි. ආර්ථික ස්ථාවරත්වය සහ සංවර්ධනය උදෙසා බලශක්ති සුරක්ෂිතතාවයේ ඇති වැදගත්කම සහ සමාජයේ සියලුම ස්තරවල පාරිභෝගිකයින් සඳහා විදුලි බලය වෙනුවෙන් සාධාරණ ප්‍රවේශයක් සලසා දීමේ අවශ්‍යතාව ඉහත ප්‍රතිපත්තියෙහි මූලික තාර්කික පදනමයි. ඒ අනුව, ජනතාවරමට ගරු කරමින්, විදුලිබල පනතේ දක්වා ඇති ලංකා විදුලිබල මණ්ඩලයෙහි අනුප්‍රාප්තික සමාගම්වල හිමිකාරිත්වයේ ව්‍යුහය (ownership structure) නැවත සලකා බැලීම සිදු කළ යුතුව පවතී.

වත්මන් විදුලිබල පනතේ 1 වන උපලේඛනයට අනුව, ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් සහ කර්තව්‍ය අවම වශයෙන් අනුප්‍රාප්තික සමාගම් දොළහකට (12) පැවරෙනු ඇත. ලංකා විදුලිබල මණ්ඩලයේ ජල විදුලිබල උත්පාදන වත්කම් පවරා ගන්නා උත්පාදන සමාගමේ, ජාතික පද්ධති ක්‍රියාකරු වන සමාගමේ සහ ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදල පවරා ගන්නා සමාගමේ සියයට සියයක කොටස් හිමිකාරිත්වය භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු වනු ඇත. භාණ්ඩාගාර ලේකම්වරයා විසින් මූලික වශයෙන් කොටස් හිමිකාරීත්වය දරනු ඇතැයි අපේක්ෂා කෙරුණ ද, සෙසු සමාගම්වල කොටස් හිමිකාරීත්වයේ ව්‍යුහය වත්මන් විදුලිබල පනතේ පැහැදිලිව සඳහන් කර නොමැත.

තවද, වත්මන් විදුලිබල පනතේ 14. (1) වගන්තියට අනුව, එහි කොටස්වලින් 50%කට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන්නා වූ සමාගමක් ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු (NTNSP) බලපත්‍රය සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍යතාව ලබයි. සම්ප්‍රේෂණ ජාලය තුළ පුද්ගලික අංශයේ ආයෝජන සඳහා මෙම විධිවිධානයෙන් පහසුකම් සැලැසුණ ද, එය සම්ප්‍රේෂණ ජාලයේ රාජ්‍ය හිමිකාරිත්වය සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රතිපත්තිය හා පටහැනි වන්නේ ය. එමෙන්ම, සම්ප්‍රේෂණ ජාලය ක්‍රියාත්මක කිරීමේ දී රජයට හිමි ස්ථානය අඩපණ කරවමින්, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු හි කොටස් හිමි තැනැත්තෙකුට හෝ සමාගමකට අතිරේක

සම්ප්‍රේෂණ බලපත්‍ර සඳහා ඉල්ලුම් කිරීමට ද මෙහි දී කිසිදු සීමාවක් නොපවතී.

තවමත් මෙගාවොට් 3,000ක උපරිම ඉල්ලුමක් අත්විඳ නොමැති ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතිය සාපේක්ෂව කුඩා පද්ධතියකි. ස්වාධීන සමාගම් ගණනාවක් ස්ථාපිත කිරීමට යාමෙන් පාලන මණ්ඩල සහ නායකත්ව කණ්ඩායම් පත් කිරීමට සිදුවීම ඇතුළු අනවශ්‍ය සංකීර්ණතා උද්ගත වීම සිදුවේ. මෙම කුඩා සමාගම්වල පාලනය හා තාක්ෂණික හැකියාවන් සෝදාපාලුවට ලක්වීමට මෙය හේතු සාධක වනු ඇත. එමෙන්ම, විදුලිබලය සඳහා වැඩිවෙමින් පවතින ඉල්ලුම සපුරාලීම සඳහා සැලකිය යුතු ආයෝජනයන් අවශ්‍යව පවතින පරිසරයක් තුළ, වෙන් වෙන් වූ ආයතන වශයෙන් වෙන් කළ කුඩා සමාගම්වල ප්‍රාග්ධනය රැස් කරගැනීමට ඇති හැකියාව දුර්වල විය හැකි ය. ලංකා විදුලිබල මණ්ඩලයෙහි අනුප්‍රාප්තික සමාගම් ලෙස පිහිටුවන, පූර්ණ වශයෙන් බෙදා වෙන් කෙරෙන උත්පාදන, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ සමාගම්වල කොටස් හිමිකාරීත්වය දැරීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරු යටතේ ක්‍රියාත්මක වනු ඇති රජය විසින් හිමිකාරීත්වය දරනු ලබන සමාගම් පිහිටුවීම නිර්දේශිත විසඳුම වන්නේ ය.

## 3.4. ජාතික විදුලිබල වෙළඳපොළ

විදුලිබල කර්මාන්තයේ වත්මන් ව්‍යුහය වන තනි ගැනුම්කාර විදුලිබල වෙළඳපොළ යනු තනි ආයතනයක් (CEB) විසින් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගෙන් (IPPs) විදුලිය මිලදී ගනු ලබන නියාමන ආකෘතියකි. තනි ගැනුම්කරු විසින් අවම පිරිවැයක් යටතේ විදුලිය සැපයීම තහවුරු කිරීමේ වගකීම දරනු ලැබේ. නියමිත දිනයට (appointed date) පසුව ජාතික පද්ධති ක්‍රියාකරු තනි ගැනුම්කරු බවට පත්වේ.

තොග විදුලිබල වෙළඳපොළ (Wholesale Electricity Market-WEM) පිහිටුවීම සහ එහි ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලැස්වීම විදුලිබල පනතේ ප්‍රධාන පරමාර්ථ අතරින් එකක් වේ. කෙසේවුවද, තොග විදුලිබල වෙළඳපොළෙහි ස්වභාවය පිළිබඳව 30 වන වගන්තිය තුළ නිසි ලෙස නියම කර දක්වා නොතිබෙන අතර 52 වන වගන්තිය තුළ තොග විදුලිබල වෙළඳපොළ පිළිබඳ අර්ථ නිරූපණය ද ප්‍රමාණවත් නොවේ.

තරඟකාරී විදුලිබල වෙළඳපොළක් පහත සඳහන් වෙළඳපොළ සංරචක සියල්ලෙන් හෝ කිහිපයකින් සමන්විත විය හැකිය:

**ද්විපාර්ශ්වික විදුලිබල වෙළඳාම හෝ අත්පිට වෙළඳපොළ/ක්ෂණික ගෙවුම් (Over the Counter - OTC) ගනුදෙනු:** විදුලිය මිලදී ගැනීම් සහ විකිණුම් සිදුවන වෙළඳපොළෙන් (electricity exchange) පරිබාහිරව වෙළඳාම් කටයුතු ද්විපාර්ශ්වික වශයෙන් සිදුකෙරෙන අතර මෙහිදී මිල ගණන් සහ ප්‍රමාණයන් පිළිබඳව ප්‍රසිද්ධ නොකෙරෙයි.

**ඉදිරි දින ඉල්ලුම් සැපයුම් වෙළඳපොළ (Day-ahead Market) (ක්ෂණික වෙළඳපොළකි):** මධ්‍යම රාත්‍රියේ සිට බෙදා හැරෙන ඉදිරි පැය 24ක විදුලිය සඳහා නිෂ්පාදකයින් සහ ගැනුම්කරුවන් විසින් ලංසු තබයි. ක්ෂණික වෙළඳපොළ (spot market) යනු ඉදිරි දින ඉල්ලුම් සැපයුම් සඳහා වන වෙළඳපොළක් (day ahead-market) වන අතර එහිදී ලංසු තැබීම අවසන් කිරීම සිදුවන්නේ බෙදාහැරීම ආරම්භයට පෙර යම් නිශ්චිත වේලාවකදී ය. මිල ගණන් සහ ප්‍රමාණයන් ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කෙරෙන සැපයුම සහ ඉල්ලුම මත පදනම් වේ. ඉදිරි දින ඉල්ලුම් සැපයුම් වෙළඳපොළට සහභාගිවන්නන් හට විදුලිය අලෙවි කිරීම හෝ මිලදී ගැනීම සඳහා ද්විපාර්ශ්විකව ගනුදෙනු සිදු කළ හැකි ආකාරයේ දිනක් තුළ ඉල්ලුම් සැපයුම් වෙළඳපොළක් (intraday market) ඇතැම් වෙළඳපොළවල පවතී, උදාහරණයක් ලෙස පැය එකක කාලයක් සඳහා විදුලිය අලෙවිකිරීම/මිලදී ගැනීමේ විදුලි ගිවිසුම් ගනුදෙනු සඳහා.

**නියාමන විදුලිබල වෙළඳපොළ (තත්කාලීන තුලන වෙළඳපොළ- Real-time Balancing Market)**: තත්කාලීන වෙළඳපොළේ ප්‍රධාන කාර්යභාරය වන්නේ සැලසුම් කරන ලද ඉදිරි දින මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට අදාළව අසමතුලිතතාවයන් මැඩපැවැත්වීම සඳහා බලශක්ති නියාමනය සිදුකිරීමයි. මෙම වෙළඳපොළ තුළ හුදෙක්ම සම්ප්‍රේෂණ පද්ධති ක්‍රියාකරුවන්ගෙන් පමණක් ඉල්ලුම් පාර්ශවය සමන්විත වන අතර අනුමැතිය ලත් සහභාගිකරුවන් පමණක් සැපයුම් පාර්ශවයෙන් සහභාගී වේ. අසමතුලිත වෙළඳපොළක් තුළ මිල ගණන් සැපයුම සහ ඉල්ලුම මත පදනම්ව වාරයෙන් වාරයට වෙනස් විය හැකි අතර, සංචිත බලශක්තිය (reserve energy) මගින් තුලනය කිරීම සක්‍රියව සිදුකෙරෙනුයේ අසමතුලිතතාවයන් සැබෑ ලෙස හටගත් විට පමණි.

**අනුසේවා වෙළඳපොළ (Ancillary Services Market):** මෙය විදුලිබල පද්ධතියේ ස්ථායිතාව සහ විශ්වසනීයත්වය පවත්වාගෙන යාම සඳහා උපකාරී වන සේවාවන්ගේ එකතුවකි. සංඛ්‍යාත නියාමන සේවා, වෝල්ටීයතා පාලන සහාය, භාවිතයට ගත හැකි අතිරික්ත විදුලි ධාරිතා (spinning reserves), බිඳවැටීමකින් පසු විදුලි සැපයුම යථා තත්වයට පත් කිරීම (black start capability), අනපේක්ෂිත විදුලි බිඳවැටීම් හෝ ඇණහිටීමකදී ප්‍රතිචාර දැක්වීම සඳහා පවත්වාගැනෙන අවිනිශ්චිත අවස්ථා විදුලි සංචිත (contingency reserves) යනාදිය මෙම සේවාවන් අතරට ඇතුළත් වේ.

**සිල්ලර විදුලිබල වෙළඳපොළ (Retail Electricity Market)**: සිල්ලර විදුලිබල වෙළඳපොළක් උපයෝගිතා සමාගම්, සිල්ලර බලශක්ති සැපයුම්කරුවන්, බලශක්ති වෙළඳුන් සහ බලශක්ති පාරිභෝගිකයින්ගෙන් සමන්විත වේ. සිල්ලර වෙළඳපොළවල් සැපයුම්කරුවන්ගේ තරඟකාරිත්වයට විවෘතව පවතින අතර, තෙවන පාර්ශවීය සැපයුම්කරුවෙකුගෙන් විදුලිය මිලදී ගැනීමට, ඉල්ලුම් ප්‍රතිචාර වැඩසටහන් වලට ඇතුළත් වීමට මෙන්ම විදුලිබල පද්ධතිය වෙත නැවත විදුලිය අලෙවි කිරීමට ද බලශක්ති පාරිභෝගිකයින් හට ඉඩ සලසයි.

ජාතික විදුලිබල වෙළඳපොළක් සකස් කිරීමට නම් මෙම විශේෂාංගයන් ක්‍රම ක්‍රමයෙන් හඳුන්වා දීම සිදුකළ යුතු ය. අනුසේවා වෙළඳපොළ වැනි ඇතැම් වෙළඳපල විශේෂාංග තනි ගැනුම්කාර ව්‍යුහය යටතේ වුවද හඳුන්වා දීමට හැකි ය. කෙසේවුවද, ඉදිරි දින ඉල්ලුම් සැපයුම් වෙළඳපොළ (day-ahead) හෝ ක්ෂණික තොග වෙළඳපොළ (wholesale spot market) හඳුන්වා දිය යුත්තේ උත්පාදන වෙළඳපොළ ප්‍රමාණවත් තරමින් තරඟකාරී විය හැකි විට දී සහ සහභාගීවන්නන් එක් අයෙකුට හෝ කුඩා කණ්ඩායමකට වෙළඳපොළ මිල ගණන් ඒකාධිකාරය සතු කරගැනීමට ඉඩකඩක් නොමැති වන විට දී ය. අධික උච්චාවචනයන් (excessive volatility) වැළැක්වීම සඳහා විදුලි මිල ගණන් ස්ථාවර කිරීමට නම් අඩු පිරිවැය විදුලි උත්පාදකයින් සමඟ ඇති කරගත් දිගුකාලීන ගිවිසුම් විශාල ප්‍රමාණයක් තොග විදුලිබල වෙළඳපොළක් සතුව තිබිය යුතු බව ගෝලීය අත්දැකීම්වලින් පෙන්වා දී ඇත.

දැඩි දින සීමා කාලරාමු මත පදනම් වෙමින් නොව, ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතිය ප්‍රගතශීලී ලෙස වර්ධනය වීම තුළ ක්‍රම ක්‍රමයෙන් තොග වෙළඳපොළක් පිහිටුවීමට ඉඩ සැලසෙන පරිදි විදුලිබල පනත සංශෝධනය කිරීමට මෙම කමිටුව විසින් නිර්දේශ කරනු ලබයි.

නියාමන විදුලිබල වෙළඳපොළ (තුලන වෙළඳපොළ) ඇතුළුව අනුසේවා වෙළඳපොළක් තනි ගැනුම්කරු ආකෘතිය (single buyer model) ඇතුළත ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ඇති ශක්‍යතාව සලකා බැලීම සහ තාප බලාගාර (thermal peaking plants) සහ අනාගත බැටරි බලශක්ති ගබඩා පද්ධති (BESS) සමඟ ඇති සියලුම විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (PPA) අනුසේවා වෙළඳපොළ වෙත ගෙනයාම මෙන්ම ජාතික පද්ධති ක්‍රියාකරු විසින් සිදුකෙරෙන ප්‍රේෂණ සමඟ ඒකාබද්ධ කිරීම යනාදිය නිර්දේශිත ක්‍රියාමාර්ගයට ඇතුළත් වන්නේ ය. සංඛ්‍යාත සහාය (frequency support) සැපයීම සඳහා නව බැටරි බලශක්ති ගබඩා පද්ධතිවලට දීමනා ගෙවමින් දිරිමත් කිරීමට අනුසේවා වෙළඳපොළට හැකි නම්, එය වත්මන් සන්දර්භය තුළ බෙහෙවින් වාසිදායක වනු ඇත.

තරඟකාරී ලෙස විදුලිය මිලදී ගැනීම සඳහා ක්ෂණික තොග විදුලි වෙළඳපොළක් (wholesale electricity spot market) හඳුන්වා දිය යුතුය. ක්ෂණික වෙළඳපොළ ස්ථාපිත කළ පසු, සම්පූර්ණයෙන්ම ස්ථාපිත කරනු ලැබූ තොග විදුලිබල වෙළඳපොළක් කරා තනි ගැනුම්කාර වෙළඳපොළ ගෙන යාමට අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම් ක්‍රියාත්මක කළ යුතුය.

ජාතික විදුලිබල වෙළඳපොළ ස්ථාපිත කිරීමේදී සිල්ලර විදුලිබල වෙළඳපොළ ක්‍රම ක්‍රමයෙන් හඳුන්වාදීම ද ඊට ඇතුළත් වන්නේ ය.

### 3.5. බලපත්‍ර දීම

බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමේ යෝග්‍යතා නිර්ණායකයන් ඉහත කොටස්වල සඳහන් කරන ලද විදුලිබල කර්මාන්තයේ සහ වෙළඳපොළ ආකෘතිවල වෙනස්කම්වලට අනුකූලව සමාලෝචනය කළ යුතුය. ඒකාධිකාරයන් (monopolies) හෝ තරඟකාරීත්වයට බාධා කෙරෙන සහයෝගීතාවන් (anti-competitive collaborations) නිර්මාණය වීම වැළැක්වීම සඳහා බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලියේදී ප්‍රමාණවත් පරීක්ෂාවන් සිදුකරනු ලැබීම අවශ්‍ය වේ.

### 3.6. සමස්ත විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ

විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ඵලදායී හා අර්ථවත් වීමට නම් ඒවායේ දුර්වලතා හඳුනා ගනු ලබමින් සහ ඊට සමගාමීව ඒවායෙහි අදාළ අණ පනත් සහ ක්‍රියාපටිපාටින් සංශෝධනය කරනු ලබමින්, ඒවායේ වර්තමාන කාර්යභාරයට පමණක් සීමා නොවන පරිදි අදාළ භූමිකාවන් සහ වගවීම ශක්තිමත් කරනු ලැබීම පිණිස විදුලිබල උපයෝගිතා ආයතනවලට (ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම) පමණක් සීමා නොකොට බලශක්ති අමාත්‍යාංශය, නියාමක ආයතනය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ විදුලිබල ක්ෂේත්‍රයේ වෙනත් ආයතනවලට ද ප්‍රතිසංස්කරණ ඇතුළත් කළ යුතුය.

ගෝලීය දේශගුණික ඉලක්කයන් හා වේගයෙන් පරිවර්තනය වන ගෝලීය බලශක්ති ප්‍රවණතා සමඟින් ශ්‍රී ලංකාව බලශක්ති ක්ෂේත්‍රය තුළ සැලකිය යුතු සංක්‍රාන්තියක් උදෙසා නෛතිකමය වශයෙන් සූදානම් විය යුතුව පවතී. මෙම අපේක්ෂිත සංක්‍රාන්තිය උදෙසා පහසුකම් සැලැස්වීමට ක්ෂේත්‍රයේ අනෙකුත් කාර්මික පනත් සමඟ ඒකාබද්ධ කළ පුළුල් බලශක්ති සංක්‍රාන්ති පනතක දැඩි අවශ්‍යතාව මතුව තිබෙන්නේ ය.

## 4. යෝජනාව

තිරසර හා සුරක්ෂිත විදුලිබල ක්ෂේත්‍රයක් ස්ථාපිත කිරීම උදෙසා විදුලිබල පනතේ පරමාර්ථ සහ අනෙකුත් වගන්ති පාර්ශවකරුවන්ගේ මූලික අදහස් සහ මතය සැලකිල්ලට ගනිමින් නැවත සලකා බැලීම අත්‍යවශ්‍යව පවතී. මෙම කමිටුව විසින් විදුලිබල පනත සඳහා වූ සංශෝධන වෙනුවෙන් සිදුකරනු ලබන යෝජනා 2 වන වගුවෙහි විස්තර කර ඇත.

මූලික හා ව්‍යුහාත්මක සංශෝධනවලට අදාළ වගන්ති සහ උප වගන්ති පමණක් මෙම වගුව 2 හි විස්තර කර ඇති අතර, හරස් යොමු සටහන් සහිත වගන්ති සහ උප වගන්ති සමාලෝචනය කොට, ඒ අනුව සංශෝධනය කිරීම සිදු කරනු ලැබිය යුතුය.

වගුව 2: 2024 අංක 36 දරන විදුලිබල පනත සඳහා සංශෝධන

| යොමුව | පවත්නා වගන්තිය | යෝජිත සංශෝධනය |
|---|---|---|
| I වන කොටස: පනතේ පරමාර්ථ | | |
| 2 වන වගන්තිය: පනතේ පරමාර්ථ | | |
| නව උපවගන්ති | | සාධාරණ සහ දැරිය හැකි මිලක් යටතේ පාරිභෝගිකයින් වෙත අඛණ්ඩ, විශ්වාසනීය, පහසුවෙන් සපයාගත හැකිවන, පිවිතුරු සහ ගුණාත්මක විදුලිබල සැපයුමක් ලබා දීම.<br><br>ඕනෑම සමාජීය, ආර්ථිකමය, මූල්‍යමය, භූ-දේශපාලනික හෝ තාක්ෂණික සංක්‍රාන්තියක්, අස්ථාවරත්වයක් හෝ ගැටුමක් වැනි සිද්ධියකදී අඛණ්ඩව විදුලිබල සැපයුම පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ක්‍රියාකාරී යාන්ත්‍රණ ස්ථාපිත කිරීම.<br><br>පිවිතුරු හා තිරසර ප්‍රභවයන් සඳහා ප්‍රමුඛත්වය දෙමින් විදුලිබල උත්පාදනයෙන් පරිසරයට සිදුවන බලපෑම් අවම කිරීම සහ අනාගත පරම්පරාවන්ට තම බලශක්ති අවශ්‍යතා සපුරාගැනීමට ඇති හැකියාව සුරක්ෂිත කිරීම.<br><br>අනාගත විදුලි සැපයුම සහ ඉල්ලුම වඩාත් පිරිමැසුම්දායී හා කාර්යක්ෂම ආකාරයන්ගෙන් කළමනාකරණය කිරීම.<br><br>විදුලි පාරිභෝගිකයින් උගත් හා ක්‍රියාශීලී පාරිභෝගිකයින් ලෙස සවිබලගැන්වීම මගින් විදුලිබල ක්ෂේත්‍රය ප්‍රජාකේන්ද්‍රීය හා ප්‍රජාතන්ත්‍රවාදී පද්ධතියක් බවට පරිවර්තනය කිරීම. |

| යොමුව | පවත්නා වගන්තිය | යෝජිත සංශෝධනය |
|---|---|---|
| 2.(ඇ) වගන්තිය | තොග විදුලිබල වෙළඳපොළ පිහිටුවීම සහ එහි ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලැස්වීම; | පළමු අදියරේදී ස්වාධීන පද්ධති ක්‍රියාකරුවකු සමඟ සම්පූර්ණ වශයෙන් කොටස් වලට වෙන් කරන ලද තනි ගැනුම්කාර විදුලිබල වෙළඳපොළ පිහිටුවීම සහ එහි ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලැස්වීම.<br><br>තනි ගැනුම්කාර විදුලිබල වෙළඳපොළ පරිණත වීමත් සහ සම්පූර්ණ වශයෙන් කොටස් වලට වෙන් කරන ලද විදුලිබල කර්මාන්තය ක්‍රියාත්මක කිරීමත් සමඟ, තරඟකාරී තොග විදුලිබල වෙළඳපොළක් සහ තරඟකාරී සිල්ලර විදුලිබල වෙළඳපොළක් ප්‍රගතිශීලී අයුරින් හඳුන්වා දීම. |
| 2.(උ) වගන්තිය | වැඩිදියුණු කරන ලද ප්‍රමිතීන්, විශ්වසනීයත්වය සහ සේවාවල ගුණාත්මකභාවය මගින් විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, වෙළඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය කිරීම තුළින් උද්ගත වන අන්තරායයන්ගෙන් ජනතාව ආරක්ෂා කිරීම; | වැඩිදියුණු කරන ලද ප්‍රමිතීන්, විශ්වසනීයත්වය සහ සේවාවල ගුණාත්මකභාවය තුළින් විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, වෙළඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය කිරීම ආශ්‍රිත අවදානම් වලින් ජනතාව ආරක්ෂා කිරීම; |
| 2.(එ) වගන්තිය | ස්වභාවික සම්පත් උපරිම ලෙස භාවිත කිරීම සහතික කරමින් ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති සහ එහි ජාත්‍යන්තර බැඳීම්වලට අනුව ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ කාබන්හරණය සැලසීම සහ පුනර්ජනනීය බලශක්තිය සහ බලශක්ති ඒකාබද්ධ කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම. | ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති සහ එහි ජාත්‍යන්තර බැඳීම්වලට අනුව ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ කාබන් විමෝචනය අවම කිරීම, පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම සහ දේශීය සම්පත් ඒකාබද්ධ කිරීම ප්‍රශස්ත ලෙස සිදුකිරීම. |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| **II වන කොටස: ජාතික විදුලිබල උපදේශක සභාව, ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කිරීම** | | |
| 3 වන වගන්තිය: ජාතික විදුලිබල උපදේශක සභාව පිහිටුවීම | | -ඉවත් කරනු ලැබීම- |
| 4 වන වගන්තිය: ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කිරීම | ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කිරීම | ජාතික බලශක්ති ප්‍රතිපත්තියේ කොටසක් ලෙස ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කිරීම. |
| 4.(1) වගන්තිය | ජාතික විදුලිබල ප්‍රතිපත්තිය මගින් 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අරමුණු පිළිබිඹු කිරීම සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 5 වන වගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති බලශක්තිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමඟ අනුකූල වන ආකාරයට විදුලිබල කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ රජයේ ප්‍රතිපත්තිය පිළිබිඹු කරනු ලැබිය යුතු ය. | ජාතික විදුලිබල ප්‍රතිපත්තිය මගින් පනතේ 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අරමුණු පිළිබිඹු කිරීම සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 5 වන වගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති බලශක්තිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමඟ අනුකූල වන ආකාරයට විදුලිබල කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග පිළිබිඹු කරනු ලැබිය යුතු ය. |
| 4.(2) වගන්තිය | මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසුව, අමාත්‍යවරයා විසින්, අනාගත ඉහළ යන විදුලිබල ඉල්ලුම සපුරාලීමට ශ්‍රී ලංකාවට හැකියාව ලබා දීමේ අදහස ඇතිව, නියාමක, ජාතික පද්ධති ක්‍රියාකරු, බලපත්‍රලාභීන්, පාරිභෝගික සංවිධාන සහ අදාළ වෙනත් පරදු දරන්නන් විමසීමෙන් පසුව සහ අදාළ සියලු ජාතික ප්‍රතිපත්ති සහ අමාත්‍යවරයාගේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අනුකූලව ජාතික විදුලිබල ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කරන ලෙස සභාව වෙත විධාන කරනු ලැබිට යුතු ය. | මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසු, අමාත්‍යවරයා විසින්, අනාගත ඉහළ යන විදුලිබල ඉල්ලුම සපුරාලීමට ශ්‍රී ලංකාවට හැකියාව ලබා දීමේ අදහස ඇතිව, සියලුම අදාළ ජාතික ප්‍රතිපත්ති සහ අමාත්‍යවරයාගේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අනුකූලව, ජාතික බලශක්ති ප්‍රතිපත්තියේ කොටසක් වශයෙන් ජාතික විදුලිබල ප්‍රතිපත්තියේ කෙටුම්පත් සකස් කිරීමට කමිටුවක් පත් කළ යුතු ය. |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| **4 වන වගන්තියෙහි උපවගන්ති:** | | හරස් යොමු සටහන් මගින් 4.(2) වගන්තිය සඳහා 'සභාව' යන්න 'අමාත්‍යවරයා විසින් පත් කරන ලද කමිටුව' ලෙස වෙනස් කරනු ලැබීම |
| **III වන කොටස: විදුලිබල කර්මාන්තය සඳහා වූ නියාමක** | | |
| 5 වන වගන්තිය: ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විදුලිබල කර්මාන්තයේ නියාමක විය යුතු බව | | |
| 5.(3) (ඉ) වගන්තිය | තොග විදුලිබල වෙළඳපොළ සහ විවෘත ප්‍රවේශය හඳුන්වා දීම සහ ක්‍රියාත්මකභාවයට පත් කිරීම සඳහා අදාළ නියෝග සැකසීම පිණිස 13 වන සහ 30 වන වගන්ති ප්‍රකාර අමාත්‍යවරයා වෙත සහාය දැක්වීම; | ජාතික විදුලිබල වෙළඳපොළ සහ විවෘත ප්‍රවේශය හඳුන්වා දීම සහ ක්‍රියාත්මකභාවයට පත් කිරීම සඳහා අදාළ නියෝග සැකසීම පිණිස 13 වන සහ 30 වන වගන්ති ප්‍රකාර අමාත්‍යවරයා වෙත සහාය දැක්වීම; |
| 5.(3) (ඒ) වගන්තිය | කලින් කලට, අවශෝෂක අයක්‍රම නියම කිරීම, උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් විදුලිබලය මිල දී ගැනීමේ අයක්‍රමය, බෙදා හැරීමේ බලපත්‍රලාභීන් වෙත ජාතික පද්ධති ක්‍රියාකරුගේ තොග විකුණුම් අයක්‍රමය, සම්ප්‍රේෂණ සහ බෙදා හැරීම් බලපත්‍රලාභීන් වෙත ගෙවිය යුතු සම්ප්‍රේෂණ අයක්‍රමය සහ විවෘත ප්‍රවේශ ගාස්තු, බෙදා හැරීමේ අයක්‍රමය සමන්විත වන අවසාන පරිශීලක පාරිභෝගික අයක්‍රමය (එනම්, බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ ජාල පිරිවැය සඳහා) සහ සැපයුම් අයක්‍රමය (එනම්, බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ විදුලිබලය මිලදී ගැනීමේ අයක්‍රමය) සහ සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් අය කර ගනු ලබන අවසර දෙනු ලබන ආදායම්; | කලින් කලට, බෙදා හැරීමේ බලපත්‍රලාභීන් වෙත ජාතික පද්ධති ක්‍රියාකරුගේ තොග විකුණුම් අයක්‍රමය, සම්ප්‍රේෂණ සහ බෙදා හැරීම් බලපත්‍රලාභීන් වෙත ගෙවිය යුතු සම්ප්‍රේෂණ අයක්‍රමය සහ විවෘත ප්‍රවේශ ගාස්තු, බෙදා හැරීමේ අයක්‍රමය සමන්විත වන අවසාන පරිශීලක පාරිභෝගික අයක්‍රමය (එනම්, බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ ජාල පිරිවැය සඳහා) සහ සැපයුම් අයක්‍රමය (එනම්, බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ විදුලිබලය මිලදී ගැනීමේ අයක්‍රමය) සහ සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් අය කර ගනු ලබන අවසර දෙනු ලබන ආදායම්; |
| 5.(3) (ඕ) වගන්තිය | දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලසුමට අනුව නව උත්පාදන ධාරිතාවයේ විවෘත තරඟකාරී ප්‍රසම්පාදනය අනුගමනය කිරීම හරහා ජාතික පද්ධති ක්‍රියාකරුගේ සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ විදුලිබලය මිලදී ගැනීමේ පිරිවැය අඩු කිරීම සහ ජාතික පද්ධති ක්‍රියාකරු විසින් පවත්නා උත්පාදන ධාරිතාවය ආර්ථිකමය වශයෙන් අඩුම පිරිවැයකට ප්‍රේෂණය කිරීම සහතික කිරීම; | දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලසුමට අනුව නව උත්පාදන ධාරිතාවයේ විවෘත තරඟකාරී ප්‍රසම්පාදනය අනුගමනය කිරීම හරහා ජාතික පද්ධති ක්‍රියාකරුගේ සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ විදුලිබලය මිලදී ගැනීමේ පිරිවැය අඩු කිරීම සහ ජාතික පද්ධති ක්‍රියාකරු විසින් පවත්නා උත්පාදන ධාරිතාවය පිරිමැසුම්දායි වශයෙන් ප්‍රේෂණය කිරීම සහතික කිරීම; |

| යොමුව | පවත්නා වගන්තිය | යෝජිත සංශෝධනය |
|---|---|---|
| **IV** වන කොටස: ජාතික පද්ධති ක්‍රියාකරු පිහිටුවීම | | |
| 11 වන වගන්තිය: ප්‍රසම්පාදනය | | |
| 11.(1) වගන්තිය | ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලසුමට අනුකූලව-<br><br>(අ) පහත දැක්වෙන කාර්යපටිපාටිය මත පදනම්ව ටෙන්ඩර් කැඳවීම මගින් විදුලිබලය උත්පාදන ධාරිතාව සහ බලශක්ති ගබඩා ධාරිතාව සැපයීම කළ යුතු ය:-<br><br>ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, යම් අලුත් උත්පාදන පිරියතක් සැපයීම හෝ (3) වන උපවගන්තියේ දක්වා ඇති පර්යන්ත ධාරිතාව ඉක්මවා පවතින පිරියතක උත්පාදන ධාරිතාව, බලශක්ති ගබඩා කිරීමේ ධාරිතාව සහ වෙනත් යම් ආකාරයේ අනුසේවාවක ධාරිතාව පුළුල් කිරීම, ඉදිරියට කරගෙන යාම සඳහා යෝජනා කැඳවිය යුතු අතර, රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර සඳහා යොදාගත් කාර්යපටිපාටි ඇතුළත් ප්‍රසම්පාදනය විනිවිදභාවයෙන් සහ තරඟකාරී ආකාරයෙන් සිදු කළ යුතු ය. එකී ප්‍රසම්පාදනය සඳහා වන විදුලිබල කර්මාන්තයේ නිශ්චිත කාර්යපටිපාටි සහ ඒ සඳහා අවශ්‍ය කරන ආකෘති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ආ(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විමසා සකස් කරනු ලැබිය යුතු අතර, එය නියම කරනු ලබන පරිදි විය යුතු ය: | ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලසුමට අනුකූලව-<br><br>(අ) පහත දැක්වෙන කාර්යපටිපාටිය මත පදනම්ව ටෙන්ඩර් කැඳවීම මගින් විදුලිබලය උත්පාදන ධාරිතාව සහ බලශක්ති ගබඩා ධාරිතාව සැපයීම කළ යුතු ය:-<br><br>ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, යම් අලුත් උත්පාදන පිරියතක් සැපයීම හෝ (3) වන උපවගන්තියේ දක්වා ඇති පර්යන්ත ධාරිතාව ඉක්මවා පවතින පිරියතක උත්පාදන ධාරිතාව, බලශක්ති ගබඩා කිරීමේ ධාරිතාව සහ වෙනත් යම් ආකාරයේ අනුසේවාවක ධාරිතාව පුළුල් කිරීම, ඉදිරියට කරගෙන යාම සඳහා යෝජනා කැඳවිය යුතු අතර, රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර සඳහා යොදාගත් කාර්යපටිපාටි ඇතුළත් ප්‍රසම්පාදනය විනිවිදභාවයෙන් සහ තරඟකාරී ආකාරයෙන් සිදු කළ යුතු ය. එකී ප්‍රසම්පාදනය සඳහා වන විදුලිබල කර්මාන්තයේ නිශ්චිත කාර්යපටිපාටි සහ ඒ සඳහා අවශ්‍ය කරන ආකෘති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ආ(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විමසා සකස් කරනු ලැබිය යුතු අතර, එය නියම කරනු ලබන පරිදි විය යුතු ය: |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| 11.(1) වගන්තිය | එසේ වුව ද -<br><br>(i) උත්පාදන පිරියතේ ධාරිතාව (3) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි පර්යන්ත අගයට පහළින් හෝ සමානව පවතින්නේ නම් සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 18 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් පුනර්ජනනීය බලශක්ති සම්පත් මාර්ගයෙන් විදුලිය උත්පාදනය කිරීම සඳහා අවසාන අනුමතය ලබා දී ඇත්තේ නම්;<br><br>(ii) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ අලුත් උත්පාදන පිරියතක් වැඩි දියුණු කිරීමට හෝ පවතින උත්පාදන පිරියතක උත්පාදන ධාරිතාව පුළුල් කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමතයක් ලබා ගෙන ඇති අවස්ථාවක; හෝ<br><br>(iii) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ ලංකා විදුලිබල මණ්ඩලය විසින්, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධානවලට අනුව, වලංගු ප්‍රදාන ලිපියක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක,<br><br>ජාතික පද්ධති ක්‍රියාකරු මේ උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම අවශ්‍ය නොවිය යුතු ය:<br><br>එසේවුවද අනුමතය ප්‍රදානය කර ඇත්තේ කුමන පාර්ශ්වයකට ද, එම පාර්ශවය හෝ ප්‍රධාන ලිපිය නිකුත් කර ඇත්තේ කුමන පාර්ශ්වයකට ද, එම පාර්ශ්වය තරඟකාරී සහ විනිවිදභාවයකින් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියකට අනුව තෝරාගනු ලැබිය යුතු ය:<br><br>එසේම තවදුරටත්, අඩුම පිරිවැයකට තැනැත්තෙකු විසින් සපයනු ලැබීමට අවශ්‍ය වන හදිසි ධාරිතාව සැපයීම හෝ විභව්‍ය ප්‍රතිලාභය දීර්ඝ ටෙන්ඩර් කැඳවීමේ ක්‍රියාවලියට වඩා වැදගත්කමකින් යුතු අවස්ථාවකදී, අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි ජාතික ව්‍යසනයක් හෝ ප්‍රධාන උත්පාදන පිරියතක අනපේක්ෂිත දීර්ඝකාලීන විදුලිය ක්‍රියා විරහිත කිරීමක් අතරතුරදී යම් හදිසි අවස්ථාවකට මුහුණ දීම සඳහා වැඩි දියුණු කරමින් පවතින යම් අලුත් උත්පාදන පිරියතයක් හෝ යම් පවත්නා උත්පාදන පිරියතයක් පුළුල් කිරීම සම්බන්ධයෙන් ටෙන්ඩරයක් භාරදීමේ අවශ්‍යතාව අදාළ කර නොගත යුතු ය. | එසේ වුව ද -<br><br>(i) උත්පාදන පිරියතේ ධාරිතාව (3) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි පර්යන්ත අගයට පහළින් හෝ සමානව පවතින්නේ නම් සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 18 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් පුනර්ජනනීය බලශක්ති සම්පත් මාර්ගයෙන් විදුලිය උත්පාදනය කිරීම සඳහා අවසාන අනුමතය ලබා දී ඇත්තේ නම්;<br><br>(ii) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ අලුත් උත්පාදන පිරියතක් වැඩි දියුණු කිරීමට හෝ පවතින උත්පාදන පිරියතක උත්පාදන ධාරිතාව පුළුල් කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමතයක් ලබා ගෙන ඇති අවස්ථාවක; හෝ<br><br>(iii) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ ලංකා විදුලිබල මණ්ඩලය විසින්, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධානවලට අනුව, වලංගු ප්‍රදාන ලිපියක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක,<br><br>(iv) අනුමතය ප්‍රදානය කර ඇත්තේ කුමන පාර්ශ්වයකට ද, එම පාර්ශවය හෝ ප්‍රධාන ලිපිය නිකුත් කර ඇත්තේ කුමන පාර්ශ්වයකට ද, එම පාර්ශ්වය තරඟකාරී සහ විනිවිදභාවයකින් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියකට අනුව තෝරාගෙන ඇති විට:<br><br>ජාතික පද්ධති ක්‍රියාකරු මේ උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම අවශ්‍ය නොවිය යුතු ය: |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| 11.(3) වගන්තිය | අමාත්‍යවරයා විසින්, සභාවේ උපදෙස් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ජාතික පද්ධති ක්‍රියාකරු සමඟ ප්‍රමාණීකෘත විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුම්වලට එළඹීමට අවසර දිය හැකි, පුනර්ජනනීය බලශක්ති තාක්ෂණය පදනම් වූ යම් විදුලි පිරියතක උපරිම ධාරිතාවය නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය: | ජාතික පද්ධති ක්‍රියාකරු සමඟ ප්‍රමාණීකෘත විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම්වලට එළඹීමට අවසර දිය හැකි, පුනර්ජනනීය බලශක්ති තාක්ෂණය පදනම් වූ යම් පිරියතක උපරිම ධාරිතාවය එහි අන්තර් සම්බන්ධ කිරීමේ ධාරිතාව මෙ.වො.1 නොඉක්මවිය යුතු ය. |
| 11.(4) වගන්තිය<br><br>නව උපවගන්තිය | | අඩුම පිරිවැයකට තැනැත්තෙකු විසින් සපයනු ලැබීමට අවශ්‍ය වන හදිසි ධාරිතාව සැපයීම හෝ විභවීය ප්‍රතිලාභය දීර්ඝ ටෙන්ඩර් කැඳවීමේ ක්‍රියාවලියට වඩා වැදගත්කමකින් යුතු අවස්ථාවකදී, අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි ජාතික ව්‍යසනයක් හෝ ප්‍රධාන උත්පාදන පිරියතක අනපේක්ෂිත දීර්ඝකාලීන විදුලිය ක්‍රියා විරහිත කිරීමක් අතරතුරදී යම් හදිසි අවස්ථාවකට මුහුණ දීම සඳහා යම් අලුත් උත්පාදන පිරියතයක් ප්‍රසම්පාදනය කිරීම හෝ යම් පවත්නා උත්පාදන පිරියතයක් පුළුල් කිරීම සම්බන්ධයෙන් ටෙන්ඩරයක් භාරදීමේ අවශ්‍යතාව ඉටුකිරීමෙන් වැළකී සිටීමට ජාතික පද්ධති ක්‍රියාකරුට හැකි ය.<br><br>ටෙන්ඩරයක් භාර දීම සිදු නොකොට උත්පාදන පිරියතවලින් හදිසියේ විදුලිය මිලදී ගැනීමේ එම කාල සීමාව එක් වසරක් (1) නොඉක්මවිය යුතු ය.<br><br>හදිසි තත්වයක් වසරකට (1) වඩා දිගු කාලයක් පැවතීමේදී නියමිත පරිදි අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය සහිතව මෙම උප වගන්තිය යටතේ විදුලිය මිලදී ගැනීමේ කාල සීමාව දීර්ඝ කළ යුතුය.<br><br>30 වන වගන්තියේ දක්වා ඇති ක්ෂණික තොග විදුලිබල වෙළඳපොළ හෝ අනුසේවා වෙළඳපොළ ස්ථාපිත කළ පසු මෙම විධිවිධානය බලාත්මක වීම අවසන් විය යුතු ය. |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| **V වන කොටස: ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු** | | |
| 14 වන වගන්තිය: ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය ඉල්ලුම් කිරීම සඳහා වන යෝග්‍යතාවය | | |
| 14.(1) වගන්තිය | 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇත්තා වූ ද, එහි කොටස්වලින් සියයට පනහකට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන්නා වූ ද, සමාගමක් නොවන කිසිම තැනැත්තෙකු, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය, මේ පනත ප්‍රකාරව ඉල්ලුම් කිරීම සඳහා යෝග්‍යතාවය නොලැබිය යුතු ය. | 'සම්ප්‍රේෂණ සමාගමේ' කොටස් වලින් සියයට සියයක් ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන විට, 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව සංස්ථාපනය කර ඇත්තා වූ ද, එහි කොටස් වලින් සියයට සියයක් 'සම්ප්‍රේෂණ සමාගම' විසින් දරනු ලබන්නා වූ ද, සමාගමක් නොවන කිසිම තැනැත්තකු ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය සඳහා මේ පනත ප්‍රකාරව ඉල්ලුම් කිරීම සඳහා යෝග්‍යතාවය නොලැබිය යුතු ය. |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| 14.(2) වගන්තිය | 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට අනුකූලව සම්ප්‍රේෂණ මාර්ගයක් ඉදිකිරීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරු විසින් ප්‍රදාන ලිපියක් නිකුත් කර ඇති යම් තැනැත්තකු විසින් අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රයක් සහ අදාළ ජාලක ක්ෂේත්‍ර සංග්‍රහයට සහ වෙනත් තාක්ෂණික ප්‍රමිතීන්ට සහ පරාමිතීන්ට අනුකූලව ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අනුමතය ලබා ගැනීම පිණිස නියාමක වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය. එවැනි අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන්ට ඔවුන් විසින් ගොඩනඟන ලද ඒ සම්ප්‍රේෂණ වත්කම්වල හිමිකාරීත්වය රඳවා තබා ගැනීමට බලය ලබා දිය යුතු අතර, ජාලක ක්ෂේත්‍ර සංග්‍රහයට අනුකූලව සහ ජාතික පද්ධති ක්‍රියාකරු විසින් තීරණය කරන පරිදි පවතින අතිරික්ත සම්ප්‍රේෂණ ධාරිතාවයට යටත්ව, යම් උත්පාදන ස්ථානයකට හෝ පරිභෝගිකයකුට විශේෂයකින් තොරව සම්ප්‍රේෂණ සම්බන්ධතාවක් සැපයීමට නියම කල යුතු ය. 10 වන වගන්තියේ (12) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ජාතික පද්ධති ක්‍රියාකරු සමඟ එළඹුණු සම්ප්‍රේෂණ සේවා ගිවිසුම ප්‍රකාරව ජාතික පද්ධති ක්‍රියාකරු විසින් ඒ සම්ප්‍රේෂණ වත්කම්වල මෙහෙයුම්කරණය දැරිය යුතු ය. | 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇත්තා වූ ද, එහි කොටස් වලින් සියයට පනහකට වඩා ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන්නා වූ ද, 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට අනුකූලව සම්ප්‍රේෂණ මාර්ගයක් ඉදිකිරීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරු විසින් ප්‍රදාන ලිපියක් නිකුත් කරනු ලැබ ඇති, සමාගමක් නොවන කිසිදු තැනැත්තකු විසින් අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රයක් සහ අදාළ ජාලක ක්ෂේත්‍ර සංග්‍රහයට සහ වෙනත් තාක්ෂණික ප්‍රමිතීන්ට සහ පරාමිතීන්ට අනුකූලව ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අනුමතය ලබා ගැනීම පිණිස නියාමක වෙත ඉල්ලීමක් කරනු ලැබීම සඳහා යෝග්‍යතාව නොලැබිය යුතුය. එවැනි අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන්ට ඔවුන් විසින් ගොඩනඟන ලද ඒ සම්ප්‍රේෂණ වත්කම්වල හිමිකාරීත්වය රඳවා තබා ගැනීමට බලය ලබා දිය යුතු අතර, ජාලක ක්ෂේත්‍ර සංග්‍රහයට අනුකූලව සහ ජාතික පද්ධති ක්‍රියාකරු විසින් තීරණය කරන පරිදි පවතින අතිරික්ත සම්ප්‍රේෂණ ධාරිතාවයට යටත්ව, යම් උත්පාදන ස්ථානයකට හෝ පරිභෝගිකයකුට විශේෂයකින් තොරව සම්ප්‍රේෂණ සම්බන්ධතාවක් සැපයීමට නියම කල යුතු ය. 10 වන වගන්තියේ (12) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ජාතික පද්ධති ක්‍රියාකරු සමඟ එළඹුණු සම්ප්‍රේෂණ සේවා ගිවිසුම ප්‍රකාරව ජාතික පද්ධති ක්‍රියාකරු විසින් ඒ සම්ප්‍රේෂණ වත්කම්වල මෙහෙයුම්කරණය දැරිය යුතු ය. |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| **VI වන කොටස: 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගම් සංස්ථාගත කිරීම** | | |
| 17 වන වගන්තිය: 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගම් සංස්ථාගත කිරීම සහ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගත කරන ලද කටයුතු එම සමාගම් සතු කිරීම | | |
| 17.(2) (ආ) වගන්තිය | I වන උපලේඛනයේ (අ), (ඊ) සහ (ඌ)(ii) අයිතමවල දක්වා ඇති සමාගම් හැර, මේ වගන්තිය යටතේ සංස්ථාගත කරන ලද අනුප්‍රාප්තික සමාගම්වල කොටස්වලින් සියයට සියයක් ආරම්භයේදී භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත පවරනු ලැබිය යුතු අතර, I වන උපලේඛනයේ (අ), (ඊ) සහ (ඌ)(ii) අයිතමවල දක්වා ඇති සමාගම් සම්බන්ධයෙන් වන විට, කොටස්වලින් සියයට සියයක් භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත ස්ථිරව ම පවරනු ලැබිය යුතු ය. | I වන උපලේඛනයේ (අ), (ආ), (ඇ), (ඊ) සහ (ඌ) (ii) අයිතමවල දක්වා ඇති මේ වගන්තිය යටතේ සංස්ථාගත කරන ලද අනුප්‍රාප්තික සමාගම්වල කොටස්වලින් සියයට සියයක් භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත ස්ථිරව ම පවරනු ලැබිය යුතු ය. |

| යොමුව | පවත්නා වගන්තිය | යෝජිත සංශෝධනය |
|---|---|---|
| 17.(2) (ඇ) වගන්තිය | | I වන උපලේඛනයේ (අ), (ආ) සහ (ඇ) අයිතමවල දක්වා ඇති මේ වගන්තිය යටතේ සංස්ථාගත කරන ලද අනුප්‍රාප්තික සමාගම්වල කොටස්වලින් සියයට සියයක් ස්ථිරව ම 'උත්පාදන සමාගම' යන (අ) අයිතමයේ සඳහන් අනුප්‍රාප්තික සමාගම වෙත පවරනු ලැබිය යුතු ය.<br><br>I වන උපලේඛනයේ (ඉ) සහ (ඌ) (එ) අයිතමවල දක්වා ඇති මේ වගන්තිය යටතේ සංස්ථාගත කරන ලද අනුප්‍රාප්තික සමාගම්වල කොටස්වලින් සියයට සියයක් ස්ථිරව ම 'සම්ප්‍රේෂණ සමාගම' යන (ආ) අයිතමයේ සඳහන් අනුප්‍රාප්තික සමාගම වෙත පවරනු ලැබිය යුතු ය.<br><br>I වන උපලේඛනයේ (උ) අයිතමයේ දක්වා ඇති මේ වගන්තිය යටතේ සංස්ථාගත කරන ලද අනුප්‍රාප්තික සමාගම්වල කොටස්වලින් සියයට සියයක් ස්ථිරව ම 'බෙදාහැරීමේ සමාගම' යන (ඇ) අයිතමයේ සඳහන් අනුප්‍රාප්තික සමාගම වෙත පවරනු ලැබිය යුතු ය. |
| 17.(3) වගන්තිය | (1) වන සහ (2) වන උපවගන්තිවල අවශ්‍යතා සපුරාලීමෙන් පසුව ද, පැවරුම් සැලැස්ම සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට අවශේෂ සමාගම් එකක් හෝ කිහිපයක් සංස්ථාගත කිරීම අවශ්‍ය බව පෙනී යන්නේ නම්, ඒ අවශ්‍ය වන අවශේෂ සමාගම් සංඛ්‍යාව 2007 අංක 07 දරන සමාගම් පනතේ ඒ සඳහා විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් සංස්ථාගත කරනු ලැබිය යුතු අතර, මේ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එකී සමාගම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. | -ඉවත් කරනු ලැබීම- |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| 18 වන වගන්තිය: පැවරුම් සැලැස්ම පිළියෙල කිරීම | | |
| 18.(2) (ඇ) වගන්තිය | (ආ) ඡේදය ප්‍රකාරව අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව පමණක්, අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමතය ඇතිව සහ නීතිය මගින් සඳහන් කර ඇති ආකාරයට විනිවිදභාවයෙන් යුතු තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් අනුගමනය කිරීමෙන් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින්, ඔහු වෙත නිකුත් කරන ලද හෝ පවරන ලද I වන උපලේඛනයේ (අ), (ඊ) සහ (උ) (ii) අයිතමවල දක්වා ඇති සමාගම් හැර, යම් අනුප්‍රාප්තික සමාගමක යම් කොටස් හෝ එම කොටස් සම්බන්ධයෙන් වන යම් අයිතිවාසිකම් බැහැර කරනු ලැබිය හැකි ය:<br><br>එසේ වුවද, (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් කොටස් බැහැර කිරීමේදී, ශ්‍රී ලංකා රජය විසින් I වන උපලේඛනයේ (ඉ) අයිතමයේ දක්වා ඇති සමාගමේ සියයට පනහකට වඩා කොටස් දරනු ලබන බවට භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් වගබලා ගනු ලැබිය යුතු ය. | -ඉවත් කරනු ලැබීම- |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| 18.(3) (අ) වගන්තිය | නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේදී ලංකා විදුලිබල මණ්ඩලය මගින් කරන ලද කාර්ය සහ කර්තව්‍ය හඳුනාගනු ලැබිය යුතු ය. | නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේදී ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි කාර්ය මණ්ඩලය විසින් කරන ලද කාර්ය සහ කර්තව්‍ය හඳුනාගනු ලැබිය යුතු අතර, I වන උපලේඛනයේ දක්වා ඇති 17 වන වගන්තියේ සඳහන් අනුප්‍රාප්තික සමාගම්වලට ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි සේවකයින්ගේ එකී කාර්ය සහ කර්තව්‍ය වෙන් කිරීම කළ යුතු ය.<br><br>එසේ වුව ද, අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදල යන දෙකම ඒ කාර්යය සඳහා පිහිටුවන ලද වෙනම සමාගමකට පවරනු ලැබිය යුතු අතර, එකී අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ ප්‍රතිලාභ නියමත දිනයට පෙරාතුවම වූ දිනයේ සේවානියුක්තයන්ට සහ ලංකා විදුලිබල මණ්ඩලයේ හිටපු සේවානියුක්තයන්ට පමණක් අදාළ විය යුතු ය:<br><br>එසේම තවදුරටත්, එවැනි අරමුදල් කළමනාකරණය කිරීම සඳහා පවරන ලද සමාගමක පාලන ව්‍යුහය නියම කරනු ලබන පරිදි විය යුතු අතර, ඒ අරමුදල්වල ආයෝජන තීරණ පිළිබඳ විමසිය යුතු නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ සේවානියුක්තයන් සහ ලංකා විදුලිබල මණ්ඩලයේ පෙර සේවානියුක්තයන් අතරින් අනුයෝජිතයන් ඇතුළත් කළ යුතු ය. |
| 18.(3) (ආ) වගන්තිය | ලංකා විදුලිබල මණ්ඩලයේ පවත්නා මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් වන විට දී, සැපයුම් වගකීම් ඇතුළත් වන්නා වූ එකී වගකීම්වල කොටසක්, ලංකා විදුලිබල මණ්ඩලයේ ජල විදුලිබල උත්පාදන වත්කම් පවරා දෙනු ලබන සහ ශ්‍රී ලංකා රජය විසින් සියයට සියයක ප්‍රතිශතයකින් හිමිකාරීත්වය දරන සමාගමක් වන්නා වූ අනුප්‍රාප්තික සමාගම වෙත පවරා දෙනු ලබන අතර, එකී වගකීම්වල ශේෂ වන කොටස පැවරීමේ සැලැස්මේ නිශ්චිතව දක්වනු ලබන යම් අනුපාතවලින්, වෙනත් අනුප්‍රාප්තික සමාගම් අතර බෙදා හරිනු ලබන බව නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය. | ලංකා විදුලිබල මණ්ඩලයේ පවත්නා මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් වන විට දී, සැපයුම් වගකීම් ඇතුළත් වන්නා වූ එකී වගකීම්වල කොටසක්, පැවරීමේ සැලැස්මේ නිශ්චිතව දක්වනු ලබන යම් අනුපාතවලින්, වෙනත් අනුප්‍රාප්තික සමාගම් අතර බෙදා හරිනු ලබන බව නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය. |

| යොමුව | පවත්නා වගන්තිය | යෝජිත සංශෝධනය |
|---|---|---|
| 18.(3) (ඈ) වගන්තිය | පහත දැක්වෙන කාර්ය සහ කර්තව්‍ය සහ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවානියුක්තිකයන් 17 වන වගන්තියේ දක්වා ඇති අනුප්‍රාප්තික සමාගම් වෙත බෙදා හැරීම සහ පසුව සතු කිරීම් කිරීමට හැකියාව ලබා දීමට ලංකා විදුලිබල මණ්ඩලයේ යම් කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන වර්ගවලට වෙන් කිරීම කළ යුතු ය: -<br><br>(i) ජලය, තාපය සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මත පදනම්ව විදුලිබලය උත්පාදනය කිරීම;<br><br>(ii) විදුලිය සම්ප්‍රේෂණය කිරීමේ සේවාවන් සහ ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය නඩත්තු කිරීම;<br><br>(iii) විදුලිබල ඉල්ලුම පුරෝකථනය කිරීම සහ සැලසුම් කිරීම,විදුලිබලය ප්‍රසම්පාදනය කිරීම සහ තොග වශයෙන් විදුලි බලය විකිණීම, විදුලිබලය පිරිමැසුම්දායක ලෙස ප්‍රේෂණය කිරීම, පද්ධති පාලන මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම ඇතුළුව කළමනාකරණය කිරීම සහ සම්ප්‍රේෂණ ජාල ව්‍යාප්ත කිරීමට සැලසුම් කිරීම; සහ<br><br>(iv) විදුලිබලය බෙදා හැරීම හෝ සැපයීම; | - ඉවත් කරනු ලැබීම - |
| 18.(3) (ඇ) වගන්තිය | 17 වන වගන්තියේ දක්වා ඇති අවශේෂ සමාගම් සතු කළ යුතු සහ ඒ සමාගම් විසින් කරනු ලැබිය යුතු සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් සහ සේවානියුක්තයන්ගේ අර්ථසාධක අරමුදල කළමනාකරණය, සහාය සේවා සහ පවත්නා මානව සම්පත විභජනය කිරීම ඇතුළුව, එහෙත් ඊට සීමා නොවූ (ඇ) වන ඡේදයේ දක්වා ඇති කාර්ය සහ කර්තව්‍යවලට ඍජුව සම්බන්ධ නොවන්නා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්ය, කර්තව්‍ය සහ කටයුතු හඳුනා ගනු ලැබිය යුතු ය; | - ඉවත් කරනු ලැබීම - |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| 18.(3) (ඉ) වගන්තිය | එකම කොටස්කරු ශ්‍රී ලංකා රජය වන 17 වන වගන්තියේ දක්වා ඇති සමාගමකට හෝ සමාගම්වලට–<br>(i) ලංකා විදුලිබල මණ්ඩලයේ පවරා නොමැති සියලු අවශේෂ වත්කම්, බැරකම්, කාර්ය සහ කර්තව්‍ය මෙන්ම ඉතිරි කාර්ය මණ්ඩලය ද වෙන් කරනු ලැබිය යුතු ය:<br>එසේ වුවද, අවශේෂ සමාගම්වල පරිපාලන වියදම් අය කරගැනීම සඳහා අවශේෂ සමාගම්වලට අනෙකුත් අනුප්‍රාප්තික සමාගම්වලින් ගෙවිය යුතු අයක්‍රමයේ අනුප්‍රමාණය නියාමක විසින් තීරණය කරනු ලැබිය හැකි අතර, එකී අයක්‍රම මුදල රැස් කිරීමේ කාර්යපටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය;<br>(ii) ලංකා විදුලිබල මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ රක්ෂකයා සහ භාරකරු ලෙස කර්තව්‍ය වෙන් කිරීම සහ එකී සේවක අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදල සහ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ගේ අර්ථසාධක අරමුදලේ වගකීම් ඉටු කිරීමට අවශ්‍ය මුදල් කළමනාකරණය කිරීමට වෙන් කරනු ලැබිය යුතු ය:<br>එසේ වුවද, අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදල යන දෙක ම ඒ කාර්යය සඳහා පිහිටුවන ලද වෙනම සමාගමකට පවරනු ලැබිය යුතු අතර, එකී අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ ප්‍රතිලාභ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ සේවානියුක්තයන්ට සහ ලංකා විදුලිබල මණ්ඩලයේ පෙර සේවානියුක්තයන්ට පමණක් අදාළ විය යුතු ය:<br>එසේම තවදුරටත්, එවැනි අරමුදල් කළමනාකරණය කිරීම සඳහා පවරන ලද සමාගමක පාලන ව්‍යූහය නියම කරනු ලබන පරිදි විය යුතු අතර, ඒ අරමුදල්වල ආයෝජන තීරණ පිළිබඳ විමසිය යුතු නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ සේවානියුක්තයන් සහ ලංකා විදුලිබල මණ්ඩලයේ පෙර සේවානියුක්තයන් අතරින් අනුයෝජිතයන් ඇතුළත් කළ යුතු ය; | - ඉවත් කරනු ලැබීම - |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| **VII වන කොටස: බලපත්‍ර දීම** | | |
| 20 වන වගන්තිය: බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමේ යෝග්‍යතාවය | | |
| 20.(3) වගන්තිය | 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා රජය විසින්-<br><br>(අ) සියයට සියයක ප්‍රතිශතයකින් එහි කොටස් දරන සීමාසහිත සමාගමක් පමණක් ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍ය විය යුතු ය;<br><br>(ආ)සියයට පනහකට වැඩි ප්‍රතිශතයකින් එහි කොටස් දරන සීමාසහිත සමාගමක් පමණක් ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍ය විය යුතු ය. | 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා රජය විසින්-<br><br>(අ) සියයට සියයක ප්‍රතිශතයකින් එහි කොටස් දරන සීමාසහිත සමාගමක් පමණක් ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍ය විය යුතු ය;<br><br>(ආ) සියයට සියයක ප්‍රතිශතයකින් එහි කොටස් දරන සීමාසහිත සමාගමක් පමණක් ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍ය විය යුතු ය;<br><br>සැකය දුරු කිරීම සඳහා; මෙම පනත යටතේ ප්‍රදානය කරනු ලබන්නේ<br><br>(i) එක් ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රයක් පමණක් බව<br><br>(ii) එක් ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රයක් පමණක් බව<br><br>මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| 20.(5) වගන්තිය | (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති සීමා කිරීමට යටත්ව, 10 වන වගන්තියේ (11) වන උපවගන්තියේ (ඇ) ඡේදයට සහ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව සම්ප්‍රේෂණ වත්කමක් ඉදිකිරීමට අයිතිවාසිකමක් අත්පත් කරගත් යම් තැනැත්තකුට අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍ර ප්‍රදානය කරනු ලැබිය හැකි ය. | (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති සීමා කිරීමට යටත්ව, 10 වන වගන්තියේ (11) වන උපවගන්තියේ (ඇ) ඡේදයට සහ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව සම්ප්‍රේෂණ වත්කමක් ඉදිකිරීමට අයිතිවාසිකමක් අත්පත් කරගත්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද්දා වූ ද, එහි කොටස් වලින් සියයට පනහකට වඩා ශ්‍රී ලංකා රජය විසින් දරන්නා වූ ද, 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට අනුකූලව සම්ප්‍රේෂණ මාර්ගයක් ඉදිකිරීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරු විසින් ප්‍රදාන ලිපියක් නිකුත් කර ඇති සීමිත සමාගමකට අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍ර ප්‍රදානය කරනු ලැබිය හැකි ය. |

| යොමුව | පවත්නා වගන්තිය | යෝජිත සංශෝධනය |
|---|---|---|
| 20.(6) වගන්තිය | තනි සමාගමක සියයට පහළොවකට වැඩි කොටස් ප්‍රමාණයක් ඍජුව හෝ වක්‍රව දරන්නා වූ, තැනැත්තකුට පහත දැක්වෙන කවර හෝ බලපත්‍ර දෙකක සංයෝජනයක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය: –<br><br>(අ) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය සහ උත්පාදන බලපත්‍රයක්;<br><br>(ආ) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය සහ බෙදා හැරීමේ බලපත්‍රයක්;<br><br>(ඇ) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය සහ ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය;<br><br>(ඈ) ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය සහ බෙදා හැරීමේ බලපත්‍රයක්;<br><br>(ඉ)ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය සහ උත්පාදන බලපත්‍රයක්;<br><br>(ඊ) උත්පාදන බලපත්‍රයක් සහ බෙදා හැරීමේ බලපත්‍රයක්; හෝ<br><br>(උ) එකකට වඩා වැඩි බෙදා හැරීමේ බලපත්‍ර. | (අ) ශ්‍රී ලංකා රජය හැර, තනි සමාගමක සියයට පහකට වැඩි කොටස් ප්‍රමාණයක් ඍජුව හෝ වක්‍රව දරන්නා වූ, තැනැත්තකුට පහත දැක්වෙන කවර හෝ බලපත්‍ර දෙකක සංයෝජනයක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය:<br><br>(i) උත්පාදන බලපත්‍රයක් සහ බෙදා හැරීමේ බලපත්‍රයක්; හෝ<br><br>(ii) එකකට වඩා වැඩි බෙදා හැරීමේ බලපත්‍ර.<br><br>(ආ) ශ්‍රී ලංකා රජය හැර, වෙනත් ඕනෑම පුද්ගලයෙකු හෝ සමාගමක් පහත සඳහන් කවර හෝ බලපත්‍ර දෙකක සංයෝජනය හිමි කරගත් සමාගම් දෙකක කොටස් වලින් සියයට පහකට වඩා එකවර ඍජුව හෝ වක්‍රව හිමිකාරීත්වය නොදැරිය යුතු ය:<br><br>(i) උත්පාදන බලපත්‍රයක් සහ බෙදා හැරීමේ බලපත්‍රයක්; හෝ<br><br>(ii) එකකට වඩා වැඩි බෙදා හැරීමේ බලපත්‍ර. |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| **VIII වන කොටස: අයක්‍රම** | | |
| 29 වන වගන්තිය: අයක්‍රම | | |
| 29.(1) වගන්තිය | (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අයක්‍රම පැනවීමේ දී නියාමක විසින් යොදාගනු ලැබිය යුතු මූලධර්ම ජාතික අයක්‍රම ප්‍රතිපත්තියේ අන්තර්ගත විය යුතු අතර, එය අනුමත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය. | (අ), (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති අයක්‍රම පැනවීමේදී බලශක්ති අමාත්‍යාංශය විසින් සහ (3) වන උපවගන්තියේ (ඈ), (ඉ), (ඊ) සහ (උ) උපවගන්තිවල දක්වා ඇති අයක්‍රම පැනවීමේදී නියාමක විසින් යොදාගනු ලැබිය යුතු මූලධර්ම ජාතික අයක්‍රම ප්‍රතිපත්තියේ අන්තර්ගත විය යුතු අතර, එය අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය. |
| 29.(2) වගන්තිය | අයක්‍රම පැනවීමේ දී, නියාමනය කරන ලද අස්තිත්වයන්හි ආයෝජනය මත වූ සාධාරණ ලාභයක් ඇතුළත් කරමින් නියාමක විසින් මූල්‍ය අඛණ්ඩත්වය තහවුරු කරනු ලැබිය යුතු ය. | අයක්‍රම පැනවීමේ දී, නියාමනය කරන ලද අස්තිත්වයන්හි ආයෝජනය මත වූ සාධාරණ ලාභයක් ඇතුළත් කරමින් බලශක්ති අමාත්‍යාංශය සහ නියාමක විසින් මූල්‍ය අඛණ්ඩත්වය තහවුරු කරනු ලැබිය යුතු ය. |
| 29.(3) වගන්තිය | ජාතික අයක්‍රම ප්‍රතිපත්තියට අනුව නියාමක විසින් නියම කරනු ලබන පරිදි පැනවීමට අවශ්‍ය අයක්‍රම විය යුත්තේ:- | ජාතික අයක්‍රම ප්‍රතිපත්තියට අනුව පැනවීමට අවශ්‍ය අයක්‍රම විය යුත්තේ:- |

| යොමුව | පවත්නා වගන්තිය | යෝජිත සංශෝධනය |
|---|---|---|
| IX වන කොටස: තොග විදුලිබල වෙළඳපොළ | තොග විදුලිබල වෙළඳපොළ | ජාතික විදුලිබල වෙළඳපොළ |
| 30 වන වගන්තිය: තොග විදුලිබල වෙළඳපොළ පිහිටුවීම | තොග විදුලිබල වෙළඳපොළ පිහිටුවීම | ජාතික විදුලිබල වෙළඳපොළ පිහිටුවීම |
| 30.(1) වගන්තිය | 1 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, එහි සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, තොග විදුලිබල වෙළඳපොළ ක්‍රියාත්මක වීම ආරම්භ කරනු ලැබිය යුතු දිනය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය. | 1 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, එහි සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, ජාතික විදුලිබල වෙළඳපොළ ක්‍රියාත්මක වීම ආරම්භ කරනු ලැබිය යුතු දිනය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය. |
| 30.(2) වගන්තිය | තොග විදුලිබල වෙළඳපොළ තරගකාරී වෙළඳපොළක් විය යුතු අතර, එය ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු මෙහෙයුම් කාර්යපටිපාටි නියම කරනු ලබන ආකාරයට විය යුතු ය. | (අ) ජාතික විදුලිබල වෙළඳපොළ තරගකාරී වෙළඳපොළක් විය යුතු අතර, එය ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු මෙහෙයුම් කාර්යපටිපාටි නියම කරනු ලබන ආකාරයට විය යුතු ය.<br><br>(ආ) ජාතික විදුලිබල වෙළඳපොළ පහත සඳහන් ඕනෑම දෙයකින් හෝ සංයෝජනයකින් සමන්විත විය යුතුය:<br><br>(i) ජාතික පද්ධති ක්‍රියාකරු සඳහා වූ සංඛ්‍යාත පාලන අනුසේවාවන්, ප්‍රතික්‍රියක ජව අනුසේවාවන් සහ බිඳවැටීමකදී විදුලිබල පද්ධතිය යථා තත්ත්වයට පත්කරවීමේ අනුසේවාවන් ඇතුළත් තරඟකාරී අනුසේවා වෙළඳපොළක්<br><br>(ii) ජාතික පද්ධති ක්‍රියාකරුගේ ඉදිරි දිනක සහ දිනක් තුළ අවශ්‍යතා සඳහා කෙටි කාලීනව විදුලිය ප්‍රසම්පාදනය කිරීම සඳහා පහසුකම් සලසන තරඟකාරී ක්ෂණික තොග විදුලිබල වෙළඳපොළක්<br><br>(iii) උත්පාදන බලපත්‍රලාභීන් සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් අතර දීර්ඝකාලීන විදුලිබල සැපයුම් කොන්ත්‍රාත්තු ගනුදෙනු සඳහා පහසුකම් සලසන තරඟකාරී තොග විදුලිබල වෙළඳපොළක් |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| 30.(3) වගන්තිය | ජාතික පද්ධති ක්‍රියාකරු විසින් සම්පූර්ණ තොග විදුලිබල වෙළඳපොළ ක්‍රියාත්මක කිරීම සඳහා (1) වන උපවගන්තිය ප්‍රකාරව යම් නියෝගයක් කිරීමට පෙරාතුව, මෙහෙයුම්, තාක්ෂණ,වාණිජමය සහ ආර්ථික පරාමිතීන් වෙළඳපොළ අධීක්ෂණ ක්‍රියාවලි හඳුනා ගනිමින් සහ නිශ්චිතව දක්වමින් තොග විදුලිබල වෙළඳපොළ කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලැස්වීම පිණිස අවශ්‍ය වන නියෝග, නියම සහ කොන්දේසි, මාර්ගෝපදේශ සහ රීති මේ පනත ප්‍රකාරව සාදනු ලැබ ඇති බවට අමාත්‍යවරයා විසින් සහතික විය යුතු ය. | ජාතික පද්ධති ක්‍රියාකරු විසින් ජාතික විදුලිබල වෙළඳපොළ ක්‍රියාත්මක කිරීම සඳහා (1) වන උපවගන්තිය ප්‍රකාරව යම් නියෝගයක් කිරීමට පෙරාතුව, මෙහෙයුම්, තාක්ෂණ,වාණිජමය සහ ආර්ථික පරාමිතීන් වෙළඳපොළ අධීක්ෂණ ක්‍රියාවලි හඳුනා ගනිමින් සහ නිශ්චිතව දක්වමින් තොග විදුලිබල වෙළඳපොළ කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලැස්වීම පිණිස අවශ්‍ය වන නියෝග, නියම සහ කොන්දේසි, මාර්ගෝපදේශ සහ රීති මේ පනත ප්‍රකාරව සාදනු ලැබ ඇති බවට අමාත්‍යවරයා විසින් සහතික විය යුතු ය. |
| 30.(4) වගන්තිය | අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව,ජාතික ආර්ථිකයේ සුබසිද්ධිය උදෙසා, තොග විදුලිබල වෙළඳපොළ පිහිටුවීමට පෙරාතුව උත්පාදන බලපත්‍රලාභීන් සමඟ විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම්වලට එළඹීම සඳහා බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට ඉඩ ලබා දිය හැකි . | මෙම පනත ක්‍රියාත්මක වීමෙන් පසු, ,ජාතික විදුලිබල වෙළඳපොළ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යුතුව, අමාත්‍යවරයා විසින්, ජාතික විදුලිබල වෙළඳපොළ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම උදෙසා පහසුකම් සැලසීම පිණිස අවශ්‍ය රෙගුලාසි, නියමයන් සහ කොන්දේසි, මාර්ගෝපදේශ සහ නීතිරීති ඇතුළත්ව ක්‍රියාත්මක කිරීමේ කාලරාමු සමගින් වෙළඳපොළ ආකෘතින් සකස් කිරීමට කටයුතු කරන ලෙස ජාතික පද්ධති ක්‍රියාකරු වෙත නියම කරනු ලැබිය යුතු ය. |

| යොමුව | පවත්නා වගන්තිය | යෝජිත සංශෝධනය |
|---|---|---|
| I වන උපලේඛනය: විදුලිබල කර්මාන්තයේ ව්‍යුහය | | |
| උපලේඛනය I:(අ) | නව අයිතමයකි | (i) ජල විදුලිබල උත්පාදනය සහ මන්නාරම සුළං විදුලි පිරියතය, (ii) නොරොච්චෝලේ ගල් අඟුරු විදුලි පිරියතය සහ ලංකා ගල් අඟුරු සමාගම, සහ (iii) අනෙකුත් තාප උත්පාදනයන් සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් සහ කර්තව්‍යයන් පවරා ගැනීම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයා විසින් සියයට සියයක කොටස් දරනු ලබන (මෙහි මින් මතු උත්පාදන සමාගම ලෙස හඳුන්වනු ලබන) එක් සමාගමක් |
| උපලේඛනය I:(ආ) | නව අයිතමයකි | (i) ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය සැකසෙන්නා වූ භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සහ (ii) ඉදිකිරීම් ව්‍යාපෘති, පුහුණු කිරීම්, තොරතුරු තාක්ෂණික විසඳුම් සහ වෙනත් සංස්ථාගත කරන ලද සමාගම්වලට පවරා නොමැති කර්තව්‍යයන් සහ කාර්යයන් සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් සහ කර්තව්‍ය පවරා ගැනීම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයා විසින් සියයට සියයක් කොටස් දරනු ලබන (මෙහි මින් මතු සම්ප්‍රේෂණ සමාගම ලෙස හඳුන්වනු ලබන) එක් සමාගමක් |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| උපලේඛනය I:(ඇ) | නව අයිතමයකි | 1, 2, 3 සහ 4 යන බෙදාහැරීමේ අංශවලට අදාළව ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් සහ කර්තව්‍ය පවරා ගැනීම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයා විසින් සියයට සියයක් කොටස් දරනු ලබන (මෙහි මින් මතු බෙදාහැරීමේ සමාගම ලෙස හඳුන්වනු ලබන) එක් සමාගමක් |
| උපලේඛනය I:(අ) | ලංකා විදුලිබල මණ්ඩලයේ ජල විදුලිබලය උත්පාදන වත්කම් පවරා ගැනීම සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සියයට සියයක කොටස් දරනු ලබන එක් සමාගමක් | ජල විදුලිබල උත්පාදනය සහ මන්නාරම සුළං විදුලි පිරියතය සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් සහ කර්තව්‍ය පවරා ගැනීම සඳහා උත්පාදන සමාගම විසින් පූර්ණ හිමිකාරීත්වය දරනු ලබන අනුබද්ධිත ආයතනයක් වන එක් සමාගමක් |
| උපලේඛනය I:(ආ) | ලංකා විදුලිබලය මෙන්ම ලංකා ගල් අඟුරු සමාගම විසින් හිමිකාරීත්වය දරන සහ ක්‍රියාත්මක කරනු ලබන ගල් අඟුරු විදුලි පිරියතය පවරා ගැනීම සඳහා එක් සමාගමක් | නොරොච්චෝලේ ගල් අඟුරු විදුලි පිරියතය සහ ලංකා ගල් අඟුරු සමාගම සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් සහ කර්තව්‍ය පවරා ගැනීම සඳහා උත්පාදන සමාගම විසින් පූර්ණ හිමිකාරීත්වය දරනු ලබන අනුබද්ධිත ආයතනයක් වන එක් සමාගමක් |
| උපලේඛනය I:(ඇ) | ලංකා විදුලිබල මණ්ඩලයේ තාප විදුලි උත්පාදන වත්කම් පවරා ගැනීම සඳහා එක් සමාගමක් | අනෙකුත් තාප උත්පාදනයන් සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් සහ කර්තව්‍ය පවරා ගැනීම සඳහා උත්පාදන සමාගම විසින් පූර්ණ හිමිකාරීත්වය දරනු ලබන අනුබද්ධිත ආයතනයක් වන එක් සමාගමක් |
| උපලේඛනය I:(ඇ) | ලංකා විදුලිබල මණ්ඩලය විසින් හිමිකාරීත්වය දරන, සන්තකය දරන සහ ක්‍රියාත්මක කරනු ලබන සුළං විදුලි පිරියතය පවරා ගැනීම සඳහා එක් සමාගමක් | - ඉවත් කරනු ලැබීම - |

| යොමුව | පවත්නා වගන්තිය | යෝජිත සංශෝධනය |
|---|---|---|
| උපලේඛනය I:(ඉ) | ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය සැකසෙන්නා වූ භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ කර්තව්‍ය පවරා ගැනීමට භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සියයට පනහකට වඩා කොටස් දරනු ලබන එක් සමාගමක් | ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය සැකසෙන්නා වූ භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම,පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් සහ කර්තව්‍ය පවරා ගැනීම සඳහා සම්ප්‍රේෂණ සමාගම විසින් පූර්ණ හිමිකාරීත්වය දරනු ලබන අනුබද්ධිත ආයතනයක් වන එක් සමාගමක් |
| උපලේඛනය I:(ඊ) | උත්පාදන කාල සටහන්ගත කිරීම, වගකීම සහ උත්පාදන පිරියතවල පිරිමැසුම්දායක ප්‍රේෂණය සම්බන්ධයෙන් වන කර්තව්‍ය සහ ලංකා විදුලිබල මණ්ඩලයේ අනාගත විදුලි සහ සම්ප්‍රේෂණ ධාරිතාව සැලසුම් කිරීම සම්බන්ධයෙන් වන කර්තව්‍ය පවරා ගැනීමට භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සියයට සියයක කොටස් දරනු ලබන එක් සමාගමක් | -කිසිඳු වෙනසක් නොකිරීම- |
| උපලේඛනය I:(උ) | ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදා හැරීම් අංශවල බෙදා හැරීමේ කර්තව්‍ය පවරා ගැනීමට වෙන් වූ සමාගම් | පිළිවෙලින් 1, 2, 3 සහ 4 ලෙස වූ බෙදාහැරීමේ අංශයන් සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් සහ කර්තව්‍ය පවරා ගැනීම සඳහා බෙදාහැරීමේ සමාගම විසින් පූර්ණ හිමිකාරීත්වය දරනු ලබන අනුබද්ධ ආයතන වන සමාගම් හතරක් |

| **යොමුව** | **පවත්නා වගන්තිය** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| උපලේඛනය I:(ඌ) | ලංකා විදුලිබල මණ්ඩලයේ අවශේෂ කර්තව්‍ය කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන සමාගම් යම් ගණනක්. වෙනත් කරුණු අතර යම් අනුප්‍රාප්තික සමාගමකට පවරනු නොලැබිය හැකි පහත දැක්වෙන අවශේෂ කර්තව්‍ය භාර ගැනීම සඳහා එකී අවශේෂ සමාගම් සංස්ථාගත කරනු ලැබිය යුතු ය | - කිසිඳු වෙනසක් නොකිරීම - |
| උපලේඛනය I:(ඌ) (i) | සංස්ථාගත කරන ලද සමාගම්වලට පැවරූ ඒ කර්තව්‍ය සහ කටයුතු හැර, ලංකා විදුලිබල මණ්ඩලයේ කර්තව්‍ය පවරා ගැනීම සඳහා එක් සමාගමක් | ඉදිකිරීම් ව්‍යාපෘති, පුහුණු කිරීම්, තොරතුරු තාක්ෂණික විසඳුම් සහ වෙනත් සංස්ථාගත කරන ලද සමාගම්වලට පවරා නොමැති අනෙකුත් කර්තව්‍ය සහ කාර්යයන් සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම් සහ කර්තව්‍ය පවරා ගැනීම සඳහා සම්ප්‍රේෂණ සමාගම විසින් පූර්ණ හිමිකාරීත්වය දරනු ලබන අනුබද්ධිත ආයතනයක් වන එක් සමාගමක් |
| උපලේඛනය I:(ඌ) (ii) | ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ කර්තව්‍ය පවරා ගැනීමට සහ අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ රක්ෂක සහ භාරකරු ලෙස කටයුතු කරමින් කළමනාකරණය කිරීම සඳහා එක් සමාගමක්, එසේ වුව ද, සමාගමේ සම්පූර්ණ කොටස් හිමිකම සෑම විටම භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු විය යුතු ය | - කිසිඳු වෙනසක් නොකිරීම - |

## 5. නිර්දේශ

මෙම කමිටුව විසින් විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් සහ විදුලිබල පනත සඳහා වන සංශෝධන සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග නිර්දේශ කෙරේ.

1. **3 වන කොටසෙහි මූලික අදහස් සහ 4 වන කොටසෙහි යෝජනා සලකා බැලීමෙන් අනතුරුව 2024 අංක 36 දරන විදුලිබල පනත සංශෝධනය කිරීම.**
2. **යෝජිත සංශෝධන සම්බන්ධයෙන් පාර්ශවකරුවන්ගේ අදහස් විමසීම සහ දැනුම හුවමාරු කරගැනීමේ සැසි පැවැත්වීම.**
3. **ක්ෂේත්‍රයේ අනෙකුත් කාර්මික පනත් සමඟ ඒකාබද්ධ කළ බලශක්ති සංක්‍රාන්ති පනතක් තුළින් බලශක්ති ක්ෂේත්‍රයේ පරිවර්තනයන් සඳහා නීති සකස් කිරීමේ කටයුතු ආරම්භ කිරීම.**